MILCO®

දේශයේ අභිමානය

මිල්කෝ (පුද්) සමාගම

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT
# 2013 - 2014

From Pure Fresh Highland Milk

## අපගේ දැක්ම

මිල්කෝ සමාගම ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම පෝෂ්‍යදායී ආහාරපාන
සමාගම බවට පත්කිරීම

## අපගේ මෙහෙවර

දේශීය කිරි ගොවියා ශක්තිමත් කරමින්, නැවුම් කිරි නිෂ්පාදනයේ
ඉලක්ක ගත වර්ධනය සාක්ෂාත් කර ගැනීමෙහිලා ක්‍රියාකාරී පාර්ශවකරුවකු වීම.
අපගේ වටිනා පාරිභෝගිකයන් හට දැරියහැකි මිලට
පෝෂ්‍යදායී ආහාරපාන සැපයීම වස් නවීන තාක්ෂණයෙන් හෙබි
අඛණ්ඩ අභිවෘද්ධි ප්‍රවේශයන් අනුගමනය කිරීම.

# පටුන


| | |
|---|---|
| ආයතනික තොරතුරු | 1 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 2 - 3 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 4 - 6 |
| ආයතනික පාලනය | 7 |
| විගණන කමිටු වාර්තාව | 8 |
| අධ්‍යක්ෂ මණ්ඩලය - සීමාසහිත මිල්කෝ (පුද්.) සමාගම | |
| විගණකවරුන්ගේ වාර්තාව | 10 - 11 |
| ආදායම් ප්‍රකාශය | 12 |
| ශේෂ පත්‍රය | 13 |
| හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 14 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 15 |
| මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් | 16 - 46 |
| මූල්‍ය විශේෂතා | 47 |

# සංස්ථානික තොරතුරු

| | |
|---|---|
| සමාගමේ නම | - සීමාසහිත මිල්කො (පුද්ගලික) සමාගම |
| නෛතික තත්ත්වය | - 1982 සමාගම් පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත සීමාසහිත වගකීම් සහිත පුද්ගලික සමාගමකි. |
| ලියාපදිංචි කාර්යාලය | - අංක 45, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.<br>- දුරකථන 0112586174, 0112582331-4, 0112586872<br>- ෆැක්ස් 0112368082, 0115333328<br>- වෙබ් අඩවිය: www.milco.lk<br>- විද්‍යුත් තැපැල: info@milco.lk |
| කර්මාන්තශාලා | - කොළඹ කිරි කම්හල (CMF)<br>- අඹේවෙල විසිරි වියළි කිරි කම්හල (SDMF)<br>- දිගන කිරි කම්හල (DMF)<br>- පොළොන්නරුව උකු කිරි කම්හල (PMF) |
| සංස්ථාගත කළ දිනය | - 1996 මැයි 09 |
| ප්‍රති ලියාපදිංචි කළ දිනය | - 2008 මැයි 19 |
| සමාගම් ලියාපදිංචි අංකය | - N (PVS) 17159 (පැරණි)<br>- PV 2942 (නව) |
| සමාගම් ලේකම් | - ෆිනෑන්ෂියල් සර්විසස් ඇන්ඩ් කොමාර්ෂල් එජන්සීස් (පුද්.) සීමාසහිත<br>අංක 28, රොස්මිඩ් පෙදෙස, කොළඹ 07. |
| අධ්‍යක්ෂවරු | - සුනිල් වික්‍රමසිංහ මයා - සභාපති<br>සංජය ලීලාරත්න මයා - නියෝජ්‍ය සභාපති<br>නවිෂාද් ජුනෙයිදීන් මයා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ<br>එස්. ලෝගනාදන් මයා - අධ්‍යක්ෂ<br>අජිත් දිසානායක මයා - අධ්‍යක්ෂ<br>තිලංක වීරසිංහ මයා - අධ්‍යක්ෂ<br>ඩබ්.පී.ආර්.එච්. පණ්ඩිතරත්න මයා - අධ්‍යක්ෂ<br>මොහාමඩ් කාදර් මහතා - අධ්‍යක්ෂ<br>එස්.එස්. මුදලිගේ මහතා - අධ්‍යක්ෂ |
| විගණකවරු | - අභ්‍යන්තර<br>1. එස්.ජේ.එම්.එස්. ඇසෝසියේට්ස්, අංක 02, කාසල් පටුමග, කොළඹ 04 - 2012 අප්‍රේල<br>2. සීමාසහිත අර්නස්ට් ඇන්ඩ් යං ඇඩ්වයිසරි සර්විස් (පුද්.) සමාගම 201, ඩී. සේරම් ප්ලේස්, කොළඹ 10 - 2012 මැයි මසට පසු<br>- බාහිර<br>බී.ඩී.ඕ. පාට්නර්ස්,<br>අංක 65/2, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,<br>කොළඹ 02. |
| බැංකුකරුවන් | - මහජන බැංකුව<br>- ලංකා බැංකුව |

*සංස්ථානික දළ විශ්ලේෂණය*

සංවර්ධනය වන ආර්ථිකයක් සහ තරඟකාරී වෙළෙඳ පොළ තත්ත්වයක් තුළ වර්ධනය වන නිෂ්පාදන පරිමාව සම්බන්ධයෙන් සමාගම ලබා ඇති ප්‍රගතිය ගැන මම සතුටු වෙමි. වාර්තා වී ඇති ලාභය, අපේක්ෂිත මට්ටමෙහි පවතී. ඩෙන්මාර්කයේ සමාගමක් වන DESMI විසින් මෙහෙයවන ලද ව්‍යාපෘතිය යටතේ පොළොන්නරුව, දිගන සහ අඹේවෙල සිදුවූ නවීකරණ පහසුකම් සැපයීම සම්පූර්ණ වීම නිසා අපට දිනකට කිරි ලීටර් 600,000ක් පිරිසැකසුමට භාජන කොට රසායනික කල්තබා ගැනීමේ ද්‍රව්‍ය නොයොදා යෝගට්, කිරි පිටි, අයිස් ක්‍රීම්, UHT කිරි (අධි උෂ්ණත්ව පිරියම යටතේ නිපදවූ කිරි), උකු කිරි, චීස් සහ මුදවපු කිරි නිපදවීමට හැකියාව ලැබී ඇත. මීට පෙර දිනකට පිරිසැකසූ කිරි ප්‍රමාණය ලීටර් 250,000කි. අපගේ කාර්යක්ෂමතාව ඉහළ නංවමින් නිෂ්පාදනවල පරිමාව ඉහළ නැංවීමට තීරණාත්මක ලෙස දායක වූ මෙම සංවර්ධන ක්‍රියාදාමය ගැන අපි ආඩම්බර වෙමු. රජයේ ප්‍රතිපත්තියට අනුකූලව නැවුම් කිරි පරිභෝජනය ජනප්‍රිය කිරීමට අපි උත්සාහ කරමු.

පොළොන්නරුව සහ දිගන අධි උෂ්ණත්ව පිරියම යටතේ නිෂ්පාදන මාදිලිය ආරම්භ කිරීමට ආයෝජනය කරන ලද්දේ මේ හේතුව නිසා ය. අපගේ ඉලක්කය වන්නේ මෙරට ජනතාවට ඉතා උසස් මට්ටමේ පෝෂණයක් ලබා දී, විදේශ විනිමය අධික ලෙස වැය වන ආනයනික කිරිපිටි පරිභෝජනය තුරන් කිරීමයි. ඉකුත් වසරේ දී, සීමිත නිෂ්පාදකයන් සමූහයකගෙන් නැවුම් කිරි මිලට ගැනීමට ප්‍රධාන සිල්ලර වෙළෙඳුන් පෙළඹුන හෙයින් හොඳ ගුණාත්මකභාවයක් ඇති කිරි ලබා ගැනීමට පැවති තරඟය වඩාත් තියුණු විය.

*මූල්‍ය ප්‍රතිඵල*

2010 වර්ෂයේ ආදායම රුපියල් බිලියන 3.5ක් වූ අතර, එය 2014 වර්ෂයේ දී රුපියල් බිලියන 8.2 දක්වා වැඩි විය. මේ අනුව ලැබුන ලාභය රුපියල් 166,376,900.00ක් විය. 2011 වර්ෂයේ දී නැවුම් කිරි ලීටර් මිලියන 52.8කට රුපියල් මිලියන 2,874ක් අප විසින් ගෙවන ලදී. 2014 දී නැවුම් කිරි මිලියන 65.6කට අප විසින් රුපියල් මිලියන 3,339ක් ගෙවන ලදී. මෙයින් ජනනය වූ ප්‍රතිලාභ ගොවි මහතුන් විසින් කළමනාකරණය කරනු ලබන සමිති 2,200ක් මගින් ගොවි මහතුන් 64,000කට ගෙවා ඇත.

සමාගමට කිරි සපයන කිරි ගොවියන්ට ද තම පිරිවැය කෙරෙහි එල්ලවන පීඩනය සුවිශේෂ ලෙස වැඩි වන බව දක්නට ලැබුණි. ඒ සමගම කිරිවලට වෙළෙඳ භාණ්ඩයක් වශයෙන් ලැබෙන අගය ද දැඩි ලෙස වැඩි වූ බැවින් අප නැවුම් කිරිවලට ගෙවන මිල ද වැඩි කිරීම අවශ්‍ය විය.

වර්ෂය තුළ විකුණුම්වලින් ලද වැඩි ආදායම ආරම්භයේ දී මිලට ගැනීම සඳහා වැඩි වූ පිරිවැය පියවීමට ප්‍රමාණවත් විය.

වර්ෂය තුළ වාර්තා කළ පරිදි මෙම ව්‍යාපාරය තවදුරටත් කාර්යක්ෂමතාව වැඩි කොට පිරිවැය අඩු කිරීම මගින් ආන්තික පීඩනයන්ගෙන් එල්ල වන පාඩුව පිරිමැසීමට උත්සාහ කරයි. එහි ප්‍රගතිය ගැන මම සතුටු වෙමි. මෙම ක්ෂේත්‍රයෙහි අඩුම පිරිවැය සහිත ක්‍රියාකරු හැටියට අප සමාගම පවතින නමුත්, සැපයුම් දාමයෙහි මුල සිට අග දක්වා, එනම්, ගොවිපොළවලින් කිරි එකතු කිරීමේ සිට පිරිසැකසුම, ඇසුරුම සහ අවසානයේ දී පාරිභෝගිකයන් අතට පත් කිරීම දක්වා පිරිවැය අඩු කිරීම අපගේ අරමුණයි. අද දින වන විට අපගේ සැපයුම් දාමයෙහි තවදුරටත් පිරිවැය අඩු කිරීමේ අවස්ථා අප විසින් හඳුනාගෙන ඇත. මෙම අවස්ථා අතර අපගේ නාරාහේන්පිට මෙහෙයුම් පහසුකම් වසා දමා බඩල්ගම අතිනූතන යන්ත්‍රාගාරයක් තැනීම ඇතුළත් ය. එම තීරණය 2014 දී අපි ප්‍රකාශයට පත් කළෙමු. ව්‍යාපාරය හරහා මෙහෙයුම් කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීමට උත්සාහ කරන අතරම, ආන්තික වාසිදායක තත්ත්වයන් වැඩි දියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීම ද අඛණ්ඩව සිදුවනු ඇත.

*ඉදිරි දැක්ම*

ඉකුත් වසරෙහි අපගේ ව්‍යාපාරය කෙරෙහි බලපැවැත් වූ තියුණු තරඟකාරී පීඩනය ගැන ඉහත සඳහන් කළෙමු. මෑත මාසවලදී අමු කිරි සැපයුම සඳහා ගෙවීම වැඩි කළෙමු. යෙදවුම් සඳහා වන පිරිවැය ආන්තික සාධක කෙරෙහි එල්ල වන බලපෑම තවදුරටත් අහිතකර ලෙස පවතින නමුත්, හැකි සෑම තැනකම අපගේ පිරිවැය පදනම වැඩි දියුණු

කිරීමට අපි වෙහෙස නොබලා කටයුතු කරමු. සමාගමේ දීර්ඝ කාලීන බලාපොරොත්තු සුබවාදී බව පාලක මණ්ඩලයේ අදහස යි.

අද මෙන්ම නුදුරු අනාගතයේ දීත් අප ඉදිරියෙහි ඇති අභියෝගය සාර්ථක ලෙස ජය ගැනීමට නම්, අපගේ කර්මාන්තයෙහි යොමුව විය යුත්තේ ලාභ සහිත සංවර්ධනයයි. අපගේ ප්‍රධාන අන්තර්ජාතික තරඟකරුවන් අපගේ වෙළෙඳ පොළට එල්ල කරන තර්ජන ගැන අපි සැබවින්ම දැනුවත් වී සිටිමු.

කිරි මිල පාලනය කිරීමට මිල්කෝ සමාගමට නොහැකි වුව ද, ගොවීන් ලබන අවසාන ප්‍රතිඵලය කෙරෙහි බලපාන යෙදවුම් පිරිවැය පාලනය කරන යෝග්‍ය සම්පත් සහ දැනුම ගොවීන්ට ලබා දීමට අපට පුළුවන. කෙටිකාලීන වෙළෙඳපොළ අභියෝගවලට සීමා නොවී, ඉන් එහා, අද දින සිට අවුරුදු 10කට පසු අප පැවතිය යුතු ස්ථානය ගැන මෙනෙහි කොට එම ස්ථානය දිනා ගැනීමට මිල්කෝහි මෙන්ම පුළුල් කිරි කර්මාන්තය තුළ, අපගේ මූලධර්ම නිවැරදිව ස්ථානගතව පවතින බවට අප සහතික විය යුතු ය. මිල්කෝ සමාගමේ උපායමාර්ගික ප්‍රමුඛතා ත්‍රිත්වය, ගොවීන්ගෙන් සහ කිරි කර්මාන්තයෙන් ලබා ගත් ප්‍රතිපෝෂණය මත රඳා පවතී. එම තෙවැදෑරුම් උපායමාර්ග නම්, ගොවිපොළ ලාභදායිත්වය ඉලක්ක කර ගැනීම, අපගේ කර්මාන්තය ආරක්ෂා කොට ප්‍රවර්ධනය කිරීම සහ පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට යි. මිල්කෝ සමාගමෙහි සේවයෙහි නියුතු අප, මිල්කෝ සමාගම කිරි කර්මාන්තයට තවදුරටත් සමීප කිරීම සඳහා, ගොවීන් සහ ගොවීන් පාලනය කරන සමිති සමග කාර්යබද්ධ වීමට නිරතුරුවම වෙහෙස වෙමු. එය අපේ ක්‍රියාදාමයෙහි යොමුවක් විය, එය සිදුකරන ආකාරය වැඩි දියුණු කිරීමෙහි අපි යෙදී සිටිමු. ඉදිරි වසර කිපය තුළ ලාභදායිත්වය සහ කිරි නිෂ්පාදනය වැඩි කිරීමට උපකාරී වන ක්ෂේත්‍ර හඳුනා ගනිමින් සිටිමු. මෙම ක්ෂේත්‍ර අතර, ගව සංඛ්‍යාව, ගොවිපළ ව්‍යාපාර කළමනාකරණය, රැකියා නියුක්තිය සහ ශ්‍රම බලකායෙහි නිපුණතාව, නව ගොවිපළ ආයෝජනය සහ අඛණ්ඩව සිදුවන කර්මාන්ත ප්‍රවර්ධනය ඇතුළත් ය. මේවා දැනට පවතින අපගේ උපායමාර්ගික ප්‍රමුඛතා සමග හොඳින් ගැලපෙයි.

අපගේ සමුපකාර ප්‍රයත්නයන්ගෙන් ඉතා වැදගත් ප්‍රතිඵල කිපයක් ලැබී ඇත. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, කිරිපට්ටි ගොවි සංවිධාන, කලාපීය ගොවීන් විසින් කළමනාකරණය කරනු ලබන සමිති සහ වෙනත් ආයතන ඇතුළු කර්මාන්තයට ඇතුළත් සංවිධාන සමග අපගේ සබඳතා ශක්තිමත් ය. ඒ සියළු සංවිධාන සහ ආයතන, කර්මාන්තයෙහි උපායමාර්ගික දිශානතිය සැලසුම් කිරීම සහ මිල්කෝ සමාගමේ ආයෝජන තීරණ ගැනීම කෙරෙහි අගනා දායකත්වයක් ලබා දී ඇත.

විශේෂයෙන් ම පාරිභෝගිකයන්ට සේවය කිරීම ඇතුළුව වර්ෂය තුළ ලබාදුන් දායකත්වය ගැන සමාගමේ සියළුම සේවකයන්ට ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. ඔවුන්ගේ අනාගතය සුවදායක වේවා යි ප්‍රාර්ථනය කරන අතරම, මෙම ව්‍යාපාරයට වසර ගණනාවක් තුළ දැක්වූ සහයෝගය සහ කැපවීම ගැන ඔවුන්ට ස්තුතිවන්ත වෙමි.

අවසාන වශයෙන්, මිල්කෝ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, ගරු ඇමතිතුමා සහ නියෝජ්‍ය ඇමතිතුමාට ද, අමාත්‍යාංශයේ ලේකම් තුමා සහ කාර්යමණ්ඩලයට ද, සියළු කටයුතුවල දී සහාය වීම සම්බන්ධයෙන් කෘතඥ වන අතර, මිල්කෝ සමාගම සහ විශේෂයෙන් කර්මාන්තයේ දියුණුවට දායක වූ සියළු දෙනාටම ද මම ස්තුතිවන්ත වෙමි.



**සුනිල් වික්‍රමසිංහ**
**සභාපති**

2014 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මිල්කෝ පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ විගණනය කළ මුදල් වාර්තාව සතුටින් ඉදිරිපත් කරමු.

**ප්‍රධාන කාර්යය**

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ නැවුම් කිරි එකතු කිරීම, පිරිසැකසුම, ඇසුරුම් කිරීම, බෙදාහැරීම සහ කිරි නිෂ්පාදන අලෙවි කිරීමයි.

**දේපළ පිරියත හා උපකරණ**

වර්ෂය තුළ දේපළ පිරියත සහ උපකරණවල අමතර එකතු කිරීම් රුපියල් මිලියන 204.5ක් වන අතර, ක්ෂය කිරීම් පෙන්වා දී ඇති පරිදි වේ.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

නව පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවීමෙන් පසු මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩලය 2010 මැයි 13 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී.

සුනිල් චන්ද්‍ර සිල්ලපන **වික්‍රමසිංහ** මයා - සභාපති

කන්කානම්ගේ සංජය **ලීලාරත්න** මයා - නියෝජ්‍ය සභාපති

මොහමඩ් නෞව්ෂාඩ් **ජුනයිදීන්** මයා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ

රාජු **සිවරාමන්** මයා M.Sc (Arch) FIA (ශ්‍රී ලංකා) - අධ්‍යක්ෂ

සෙල්වදොරෙයි **ලෝගනාදන්** මයා FCMA (UK) FSCMA (ශ්‍රී ලංකා) - අධ්‍යක්ෂ

ආචාර්ය අජිත් **දිසානායක** මයා (Ph.D) - අධ්‍යක්ෂ

තිලංක **වීරසිංහ** මයා - නීතිඥ, ප්‍රසිද්ධ නොතාරිස්, දිවුරුම් කොමසාරිස් - අධ්‍යක්ෂ

අරිනේසරාජා **ශක්තිවේල්** මයා - පශ්චාත් උපාධි ඩිප්ලෝමා (කෘෂිකර්මය) ආර්ථික විද්‍යා (එක්සත් රාජධානිය) B.D. (පශු) පේරාදෙනිය - අධ්‍යක්ෂ

රත්නතිලක **ලේකම්ගේ** මයා - අධ්‍යක්ෂ

පහත නම් සඳහන් අධ්‍යක්ෂවරු මෙහි දැක්වෙන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වූහ/පත්වූහ.

අරිනේසරාජා **ශක්තිවේල්** මයා - 2010 දෙසැම්බර් 21 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය.

රත්නතිලක **ලේකම්ගේ** මයා - 2010 දෙසැම්බර් 21 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය.

දනුක **දික්වැල්ල** මයා - 2010 දෙසැම්බර් 21 දින සිට බලපැවැත්වෙන පරිදි පත්විය.

දගිකා **එඩ්වර්ඩ්ස්** මිය - 2011 ජනවාරි 12 දින සිට බලපැවැත්වෙන පරිදි පත්විය - ඉංග්‍රීසි භාෂා උපාධිය.

දනුක **දික්වැල්ල** මයා - 2011 අප්‍රේල් 26 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය.

ඩබ්.පී.ආර්.එච්. **පණ්ඩිතරත්න** මයා - 2011 අප්‍රේල් 26 දින සිට බලපැවැත්වෙන පරිදි පත්විය.

දගිකා **එඩ්වර්ඩ්ස්** මිය - 2012 දෙසැම්බර් 28 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය.

රාජු **සිවරාමන්** මයා - M.Sc (Arch) FIA (ශ්‍රී ලංකා) - 2012 දෙසැම්බර් 28 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය.

මොහමඩ් **කාදර්** මහතා - 2013 ජනවාරි 10 සිට බලපැවැත්වෙන පරිදි පත්විය.

එම්.පී.ඩී.යූ.කේ. මාපා පතිරණ මහතා - 2012 දෙසැම්බර් 17 දින සිට බලපැවැත්වෙන පරිදි පත්විය (මහා භාණ්ඩාගාරයේ නියෝජිත)

එම්.පී.ඩී.යූ.කේ. මාපා පතිරණ මහතා - 2013 මාර්තු 27 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය.

එස්.එස්. මුදලිගේ මහතා - 2013 අප්‍රේල් 24 දින සිට බලපැවැත්වෙන පරිදි පත්විය (මහා භාණ්ඩාගාරයේ නියෝජිත)

### කොටස් පිළිබඳ තොරතුරු

සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ප්‍රමාණයෙන් සහ අගයෙන් රුපියල් මිලියන 319.4ක් විය.

### සංචිත

ඉදිරියට ගෙන ආ සමුච්චිත ලාභය වන රු. 1,035,313,218/- වර්තමාන වර්ෂයේ බදු අය කිරීමෙන් පසු ශුද්ධ ලාභය වන රු. 166,376,900/-ට ගලපන ලදුව අදාළ තොරතුරු ගිණුම් ප්‍රකාශයේ 3 වන පිටුවේ දැක්වේ.

වසර අවසාණයේ පැවති ප්‍රාග්ධන සංචිතය වන රු. 25,000,000 සහ නිදන් අරමුදල වන රු. 1,689,978 සංචිතවලට ඇතුළත් ය.

### ගිවිසුම්වලදී අධ්‍යක්ෂවරුන්ගේ අභිමතය

සමාගමේ අධ්‍යක්ෂවරුන් සමාගමේ කොන්ත්‍රාත් කටයුතුවලදී සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වී නොමැත.

### ආයතනික පාලනය

සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් සංස්ථානික යහ පාලනය සහතික කරනු ලැබේ. සමාගමේ අරමුණු මෙන්ම උනන්දුවන්නන්ගේ බලාපොරොත්තු සමග අනුකූලවන කාර්යසාධනය සහතික කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

### බදුකරණය

පොලි ආදායමින් සහ විලම්භිත බද්දෙන් ඇතිවන ආදායම් බදු බැඳියාව රු. 20,699,439/-කි. මෙහෙයුම් කටයුතුවල ලාභය 2006 වර්ෂයේ අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 16 වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇත.

### ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට, සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවීමට ඇති සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වේලාවට නිවැරදිව ගෙවා ඇති බවට අධ්‍යක්ෂවරුන්ගේ දැනුම සහ විශ්වාසය අනුව සෑහීමකට පත්වේ.

### අනුකූලතාවය

සමාගම ශ්‍රී ලංකාවේ හෝ වෙනත් දේශයකට අදාළ වන නීති සහ රෙගුලාසිවලට පටහැනි වන කිසිදු කාර්යයක නිරත වී නොමැත.

### අඛණ්ඩ පැවැත්ම

**ඉදිරියට දැකිය හැකි කාලය තුළ සමාගමට, එහි මෙහෙයුම් කටයතු අඛණ්ඩව කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට අධ්‍යක්ෂවරුන් සෑහීමට පත්වේ. මෙම අරමුණ මත පිහිටා සමාගමේ ගිණුම් සකස් කිරීමේ දී අප අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය යොදාගනිමු.**

### විගණකවරුන් පත්කිරීම

2014.03.31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා සමාගමේ ගිණුම් විගණනය කිරීමට වරලත් ගණකාධිකාරිවරුන් වන M/S BDO Partners ආයතනය විගණකාධිපති විසින් නම් කරන ලද අතර, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරන ලදී. අධ්‍යක්ෂවරුන් දැනුවත් වී ඇති පරිදි විගණකවරුන්ට සමාගම සමග හෝ ඔවුන්ගේ නිදහසට බලපෑමක් කළ හැකි එහි උප සමාගම් සමග කිසිදු සම්බන්ධතාවයක් නොමැත.

### මණ්ඩලයේ අණ පරිදි

අත්සන් කළේ,

……………………………… 
අධ්‍යක්ෂ

……………………………… 
අධ්‍යක්ෂ

……………………………….. 
සමාගම් ලේකම්

ෆිනෑන්සියල් සර්විසස් හා කොමර්ෂල් එජන්සීස් (පුද්ගලික) සමාගම 
(වශ/555/91) 
අංක 28, රොස්මීඩ් පෙදෙස, 
කොළඹ 07.

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මසකට වරක් රැස්වීම් පවත්වා ඇත. මූල්‍ය පාලනය පවත්වා ගැනීම සහතික කිරීමෙහි ලා සංයුක්ත සැලැස්ම සහ වාර්ෂික අයවැය මුඛ්‍ය මෙවලම් විය. එම සංයුක්ත සැලැස්ම සහ වාර්ෂික අයවැය, මුදල් වර්ෂය ආරම්භයේ දී සියළු රේඛීය කළමනාකරුවන් සමග සාකච්ඡා කොට සකස් කරන ලදුව මණ්ඩලය විසින් අනුමත කර ඇත.

ඉකුත් මස හා සැසඳීමක් සමග මාසික කාර්යසාධන වාර්තාව සහ අයවැය මාසික රැස්වීමේ දී නිතිපතා සභාගත කර ඇත. මෙම වාර්තා, ඉලක්ක සමග, මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධනය ගැන කාලීන තොරතුරු සපයන අතර, සමාගමේ ලාභ සහ පාඩු අනුව ඵලදායි කළමනාකරණ තීරණ ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට ප්‍රයෝජනවත් වේ.

## විගණන කමිටුව

විගණන කමිටුවෙහි මුලසුන දැරිය යුත්තේ මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා ය. විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙක් විගණන කමිටුවේ සාමාජිකයන් හැටියට සේවය කළ හ. මෙම කමිටුව මණ්ඩලයේ උප කමිටුවක් හැටියට සේවය කළේ ය. කමිටුවට අභ්‍යන්තර විගණකගේ සහාය ද ලැබුණි. අභ්‍යන්තර විගණන සේවය, වැඩි ස්වාධීනත්වයක් සහතික කිරීම සඳහා බාහිර වශයෙන් ලබා ගැනීමට කටයුතු කර ඇත.

වර්ෂය තුළ අභ්‍යන්තර විගණකයන් හැටියට සීමාසහිත අර්නස්ට් ඇන්ඩ් යං ඇඩ්වයිසරි සර්විස් (පුද්.) සමාගම සේවය කළ අතර, එම සේවය ප්‍රධාන කාර්යාලයට අමතරව කොළඹ, අඹේවෙල සහ දිගන කම්හල්වල නේවාසික නිලධාරීන් සහිත ශාඛා කාර්යාල මගින් ද ක්‍රියාත්මක වේ.

අභ්‍යන්තර විගණනවරුන් විසින් සකස් කරනු ලබන විගණන සැලැස්මක් වර්ෂය ආරම්භයේ දී අනුමැතිය සඳහා විගණන කමිටුවට ඉදිරිපත් කරනු ලැබේ. මෙම සැලැස්මට අනුව වසර තුළ අභ්‍යන්තර විගණන පිරික්සුම් සිදු කරනු ලැබේ. විගණනයෙන් සොයාගත් කරුණු පිළිබඳ විස්තරාත්මක වාර්තා ප්‍රථමයෙන් අදාළ කළමනාකරුවන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමග සාකච්ඡා කොට, ඔවුන්ගේ අදහස් සහ ප්‍රතිචාර පදනම් කොට ගෙන සාරාංශ වාර්තාවක් සකසා විගණන කමිටුවේ සමාලෝචනය සහ අනුගාමී කටයුතු සඳහා ඉදිරිපත් කරනු ලැබේ. විගණන කමිටුව මසකට වරක් රැස් වේ.

## ආයතනික කළමනාකරණය

තම කොටස්කරුවන්ට සාධාරණ නිරවද්‍යතාවයකින් යුක්තව සමාගමේ මූල්‍ය තත්ත්වය ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි සමාගමේ මූල්‍ය වාර්තා තබාගන්නා බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වෙයි. තව ද, ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සහ සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කොට ඉදිරිපත් කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වෙයි.

විගණක කමිටුව, පොදු ව්‍යවසාය යහපාලන නියාමනයන් සහ නීති අනුව, විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු ය. ඉන් එක් අධ්‍යක්ෂවරයෙන් මහා භාණ්ඩාගාරයේ නියෝජිත විය යුතු අතර, ඔහු කමිටුවේ සභාපතිවරයා ද වන්නේ ය. කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගෙන් සමන්විත වූ අතර, සමාලෝචිත වර්ෂය තුළ පහත අත්සන් කරන මම එහි සභාපතිවරයා හැටියට කටයුතු කළෙමි.

2013/2014 කාලය තුළ නිතිපතා රැස්වීම් පවත්වන ලදී. මූල්‍ය පාලක සහ අභ්‍යන්තර විගණන ආරාධනය පරිදි සියළුම රැස්වීම්වලට සහභාගී විය.

විගණක කමිටු රැස්වීම්වල පරමාර්ථය වන්නේ මාසික අභ්‍යන්තර විගණක වාර්තා සහ විමසුම් විස්තරාත්මකව සමාලෝචනය කිරීම ය. එම වාර්තා සහ විමසුම්වල වෙනස දක්වා ඇති ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය සැකහැර ගැනීම් සහ පැහැදිලි කිරීම් ලබාගැනීම සඳහාත්, වැරදි නිවැරදි කර ගැනීම සිදුවන බව සහතික කර ගැනීම සඳහාත්, ඒ අනුව කරනු ලබන නිර්දේශ සංනිවේදනය කොට නිසිකල ක්‍රියාත්මක කොට අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහාත්, අදාළ ක්‍රියාකාරී ප්‍රධානීන් සමග සාකච්ඡා කරනු ලැබේ.

අභ්‍යන්තර විගණනවරු විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් සාකච්ඡාවට භාජනය කළ විගණන කමිටු රැස්වීම් 9ක් සමාලෝචිත වර්ෂය තුළ දී පැවැත්වීමට විගණන කමිටුවට හැකි විය. මතුකර තිබූ සියළු වැදගත් ගැටළු නිරීක්ෂණය කොට අනුයාත ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සඳහා අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට අවශ්‍ය උපදෙස් දෙන ලදී.

විගණන කමිටුව, බාහිර විගණනවරුන් ඉදිරිපත් කළ කළමනාකරණ වාර්තාව සමාලෝචනය කොට, සභාපති, නියෝජ්‍ය සභාපති සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂකට එම කළමනාකරණ වාර්තාවේ සෑම අංශයක් ම විස්තරාත්මකව අධ්‍යයනය කොට, සමාගමේ තත්ත්වය දියුණු කිරීමේ අරමුණ ඇතිව, ඉදිරිපත් කර ඇති කරුණු සම්බන්ධයෙන් යෝග්‍ය පියවර ගන්නා ලෙස උපදෙස් දුන්නේ ය.

**එස්.එස්. මුදලිගේ**
සභාපති - විගණන කමිටුව
සීමාසහිත මිල්කෝ (පුද්.) සමාගම

# අධ්‍යක්ෂ මණ්ඩලය
# සීමාසහිත මිල්කෝ සමාගම



**වමේ සිට දකුණට**

ආචාර්ය අජිත් දිසානායක මහතා - අධ්‍යක්ෂ, ඩබ්.පී.ආර්.එච්. පණ්ඩිතරත්න මහතා - අධ්‍යක්ෂ,
තිලංක වීරසිංහ මහතා - අධ්‍යක්ෂ, කේ. සංජය ලීලාරත්න මහතා - නියෝජ්‍ය සභාපති,
සුනිල් වික්‍රමසිංහ මහතා - සභාපති, එම්. නොවුෂාඩ් ජුනයිඩීන් මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ,
සෙල්වදුරෙයි ලෝගනාදන් මහතා - අධ්‍යක්ෂ, මොහමඩ් කාදර් මහතා - අධ්‍යක්ෂ, එම්.පී.ඩී.යූ.කේ. මාපා පතිරණ මහතා - පැමිණියේ නැත

**මූල්‍ය ප්‍රකාශන ගැන වාර්තාව**

2014 මාර්තු 31 වන දිනට පැවති මූල්‍ය තත්ත්වය ද, විස්තරාත්මක ආදායම් ප්‍රකාශය ද, හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ද, සුවිශේෂී ගිණුම් ප්‍රතිපත්ති සාරාංශය ද, පිටු 5 සිට 35 දක්වා පලකර ඇති අනෙක් පැහැදිලි කිරීමේ සටහන් ද ඇතුළත් වූ අමුණා ඇති සීමාසහිත මිල්කෝ (පුද්.) සමාගමේ මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී.

## මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ කළමනාකාරිත්වයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සකස් කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකාරිත්වයේ වගකීමකි. මෙම වගකීමට ඇතුළත් කරුණු මෙසේ ය: වංචාවක් හෝ වැරදීමක් මගින් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශ සම්පාදනය සහ සාධාරණව ඉදිරිපත් කිරීමට අදාළ අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගැනීම; යෝග්‍ය ගිණුම් ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීම; පවත්නා තත්ත්වය යටතේ සාධාරණ වන්නා වූ ගිණුම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම.

**විගණනයේ විෂය පථය සහ මතය සඳහා පදනම**

විගණනය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශ ගැන මතයක් ප්‍රකාශ කිරීම අපගේ වගකීමකි. ජේද (අ), (ආ) සහ (ඇ)වල කරුණු ඉදිරිපත් කර ඇති පරිදි හැර, සෙසු කොටස් සම්බන්ධයෙන් අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිති අනුව සිදුකර ඇත. මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන කරුණ පිළිබඳ සාධාරණ සහතික වීමක් ලැබෙන අයුරින් විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කිරීම ගිණුම් ප්‍රමිතිවලින් අපේක්ෂිත ය.

මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන ප්‍රමාණ සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම විගණනයට ඇතුළත් ය. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දි කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම ඇගයීම ද විගණනයට ඇතුළත් ය.

අපගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි (අ), (ආ), (ඇ) ජේද හැර සෙසු කොටස් සම්බන්ධයෙන් විගණන කටයුතු සඳහා අවශ්‍යවන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් අපහට ලැබී ඇත. එබැවින් අපගේ කොන්දේසි සහිත වූ මතය සඳහා සාධාරණ පදනමක් අපගේ විගණනයෙන් ලැබී ඇති බව විශ්වාස කරමු.

**මතය**

(අ) පොළී සහිත ණය දීම සහ ණය ගැනීම / පොළී රහිත ණය දීම සහ ණය ගැනීම

කෘෂිකර්ම සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට ගෙවිය යුතු රු. 83,590,654/-ක් වන ශේෂයෙහි නිරවද්‍යතාවය සහ පැවැත්ම ස්වාධීනව සත්‍යාපනය සඳහා සෘජු සනාථ කිරීම් වැනි සතුටුදායක සාක්ෂි අපට ලැබී නැත.

සමාගමේ වාර්තාවල ස්වභාවය නිසා ශේෂපත්‍ර දිනට එබඳු ගෙවිය යුතු දෑවල පැවැත්ම සහ සම්පූර්ණත්වය ගැන සෑහීමට පත්වීම සඳහා අන්‍ය විගණන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට අපට නොහැකි විය.

(ආ) වෙළෙඳාම සහ වෙනත් ගෙවිය යුතු දෑ

සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 20,446,164/-ක ශේෂයෙහි පැවැත්ම සහ නිරවද්‍යතාවය ස්වාධීනව සත්‍යාපනය සඳහා සෘජු ස්ථිර කිරීම වැනි සතුටුදායක සාක්ෂි අපහට ලැබී නැත.

සමාගමෙහි ගිණුම්වල ස්වභාවය හේතු කොට ගෙන එබඳු බැරකමක පැවැත්ම සහ සම්පූර්ණත්වය ගැන සෑහීමට පත්වීම සඳහා අන්‍ය විගණන ක්‍රියාකාරකම් ඉටුකිරීමට අපට නොහැකි විය.

(ඇ) විකුණුම් පිරිවැය

බඩු තොග ලේඛනයෙහි සහ විකුණුම් පිරිවැයෙහි රු. 38,297,591/-ක් සඳහා වන ගැලපුමෙහි නිරවද්‍යතාවය සත්‍යාපනය කිරීම සඳහා සනාථ කිරීමේ සතුටුදායක විගණන සාක්ෂි අපට ලැබී නැත.

සමාගමෙහි වාර්තාවල ස්වභාවය හේතුකොට ගෙන මූල්‍ය ප්‍රකාශයන්හි විකුණුම් පිරිවැය සහ බඩුතොග ලේඛනයෙහි එබඳු ගැලපුම්වල පැවැත්ම සහ නිරවද්‍යතාවය ගැන සෑහීමකට පත්වීම සඳහා අන්‍ය විගණන ක්‍රියාකාරකම් ඉටු කිරීමට අපට නොහැකි විය.

(ඈ) වෙනත් වියදම්

තුන්වන පාර්ශ්වයන්ට රු. 272,625,835/-ක් වටිනා අමු කිරි විකිණීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18 අනුව ගිණුම් තබා නැත. ආදායම ගනුදෙනුවල ශුද්ධ බලපෑම වෙනත් වියදම් යටතේ රු. 27,684,947/-ක ශුද්ධ පාඩුවක් ලෙස ගිණුම් තබා ඇත.

අපගේ පරීක්ෂණවලින් පෙනියන පරිදි (අ), (ආ), (ඇ) ජේදවලින් පෙන්වා දී ඇති කරුණු ගැන අපට සෑහීමට පත්වීම සඳහා අවශ්‍ය විය හැකි ගැලපීම්වල බලපෑම හැරුණ විට සහ ජේද (ඈ)වලින් දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශවලට වන බලපෑම හැර, සමාගම 2014 මාර්තු 31න් අවසන් වන වර්ෂය සඳහා විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ගෙන ඇති බවත් 2014 මාර්තු 31 දිනට සමාගමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදින අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව සමාගමේ පාඩුව සහ මුදල් ප්‍රවාහය ගැන සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බවත්, අපගේ මතය වේ.

**කරුණු අවධාරණය කිරීම**

තවදුරටත් අපගේ මතය සීමා නොකර, මූල්‍ය ප්‍රකාශවල 14.5 සහ 24.1 සටහන් වෙත අවධානය යොමු කරමු.

**වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2007 වර්ෂයේ අංක 07 දරණ සමාගම් පනතේ අංක 151(2) වගන්තිය අනුව පනවා ඇති අවශ්‍යතාවලට මෙම මූල්‍ය ප්‍රකාශ අනුකූල වේ.

වරලත් ගණකාධිකාරීන්,
කොළඹ
2014 ඔක්තෝබර් 27
SSR/cc

# මිල්කෝ (පුද්ගලික) සමාගම 2014 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විස්තරාත්මක ආදායම් ප්‍රකාශය

| | සටහන | 2013/2014 රු. | 2012/2013 රු. |
|---|---|---|---|
| ආදායම | 3 | 7,019,769,523 | 6,385,233,896 |
| විකුණුම් පිරිවැය | | (6,014,077,202) | (5,898,800,752) |
| දළ ලාභය | | 1,005,692,321 | 486,433,144 |
| අනෙකුත් ආදායම් | 4 | 33,567,719 | 18,360,458 |
| | | 1,039,260,040 | 504,793,602 |
| පරිපාලන වියදම් | | (592,005,140) | (517,309,520) |
| බෙදාහැරීමේ වියදම් | | (212,607,131) | (152,965,856) |
| අනෙකුත් වියදම් | | (29,961,747) | (57,266,103) |
| මෙහෙයුම්වලින් ලාභය / (අලාභය) | | 204,686,022 | (222,747,877) |
| මූල්‍ය ආදායම | 5 | 109,023,269 | 85,582,743 |
| මූල්‍ය වියදම් | 6 | (152,602,195) | (130,303,147) |
| බද්දට පෙර ශුද්ධ ලාභය / (අලාභය) | 7 | 161,107,096 | (267,468,281) |
| ආදායම් බදු වියදම් | 8 | (20,699,439) | (30,554,531) |
| වර්ෂය සඳහා බදුවලට පසු ලාභය / (අලාභය) | | 140,407,657 | (298,022,812) |
| වෙනත් විස්තරාත්මක ආදායම | | | |
| නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම මත බදුවලට පෙර ආයුගණක ලාභය / (පාඩුව) | | 25,969,243 | 8,305,315 |
| බදුවලට පෙර වෙනත් පූර්ණ විස්තරාත්මක ආදායම | | 25,969,243 | 8,305,315 |
| පූර්ණ විස්තරාත්මක ලාභය / (අලාභය) | | 166,376,900 | (289,717,497) |
| මූලික (අලාභය) ¸- කොටසකට ඉපැයුම | 9 | 4.40 | (9.33) |

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් වේ.

පිටු අංක 5 සිට 35 දක්වා සඳහන්ව ඇති ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශවල අනුකලන කොටස් වේ

**2014 ඔක්තෝබර් 27**
**කොළඹ**

# මිල්කෝ (පුද්ගලික) සමාගම
# 2014 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය

| | සටහන් | 2014 මාර්තු 31ව<br>රු. | 2013 මාර්තු 31ව<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ පිරියත හා උපකරණ | 10 | 1,216,457,203 | 1,179,966,653 |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | 11 | 121,433,331 | 152,183,113 |
| මූල්‍ය මෙවලම් කල්පිරීම දක්වා තබාගැනීම | 15 | 906,182,013 | 791,211,741 |
| | | 2,244,072,547 | 2,123,361,507 |
| ජංගම වත්කම් | | | |
| පශු සම්පත් | 12 | 86,000 | 159,800 |
| තොගය | 13 | 606,043,554 | 545,276,044 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 14 | 1,321,965,074 | 1,155,531,463 |
| මූල්‍ය මෙවලම් කල්පිරීම දක්වා තබා ගැනීම | 15 | 325,000,000 | 294,500,000 |
| මුදල් හා ඒ සමාන දෑ | 16 | 33,748,164 | 73,589,060 |
| | | 2,286,842,792 | 2,069,056,367 |
| මුළු වත්කම් | | 4,530,915,339 | 4,192,417,874 |
| **හිමිකම් හා වගකීම්** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය හා සංචිත | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 17 | 319,454,060 | 319,454,060 |
| ප්‍රාග්ධන සංචිත | 18 | 25,000,000 | 25,000,000 |
| ප්‍රති ඇගයුම් සංචිත | | 336,454,462 | 336,454,462 |
| නිදන් අරමුදල | 19 | 1,689,978 | 1,689,978 |
| රඳවාගත් සංචිත | | 911,972,621 | 745,595,721 |
| කොටස් කරුවන්ගේ අරමුදල | | 1,594,571,121 | 1,428,194,221 |
| ජංගම නොවන වගකීම් | | | |
| විලම්භිත බදු වගකීම් | 20 | 25,952,174 | 19,857,289 |
| පොලී රහිත ණයට ගැනුම් | 21 | 85,698,717 | 85,698,717 |
| පොලී සහිත ණය ගැනුම් - දීර්ඝ කාලින | 21 | 493,912,087 | 581,685,663 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂික | 22 | 434,250,500 | 401,297,112 |
| විලම්භිත ආදායම - රජයේ ප්‍රදාන | 23 | 41,162,342 | 52,297,084 |
| | | 1,080,975,820 | 1,140,835,865 |
| ජංගම වගකීම් | | | |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දේ | 24 | 981,778,004 | 977,948,081 |
| ආදායම් බදු වගකීම | 25 | 13,667,232 | 9,917,476 |
| පොලී සහිත ණයට ගැනීම් - කෙටි කාලින ණය | 21 | 102,105,535 | 92,751,742 |
| බැංකු අයිරා | 26 | 757,817,627 | 542,770,489 |
| | | 1,855,368,398 | 1,623,387,788 |
| මුළු හිමිකම් සහ වගකීම් | | 4,530,915,339 | 4,192,417,874 |

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් වේ.

බැඳීම් සහ අසම්භාව්‍යයන් 27 සහ 28

05 පිටුවේ සිට 39 පිටුව දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල බව සහතික කරමි.

.....................................

සී මඩුගල්ලේ

මූල්‍ය පාලක

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරමි.

.....................................
එස්.සී.එස්. වික්‍රමසිංහ
සභාපති

.....................................
එස්. ලෝගනාදන්
අධ්‍යක්ෂ

2014 ඔක්තෝම්බර් 27 දින

කොළඹ

SSR/fm

| | ප්‍රකාශිත ප්‍රාග්ධන රු. | ප්‍රාග්ධන සංචිත රු. | ප්‍රති ඇගයුම් සංචිත රු. | නිදන් අරමුදල රු. | රඳවාගත් ඉපැයුම් රු. | මුළු එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| 2012.04.01 දිනට ශේෂය | 319,454,060 | 25,000,000 | 336,454,462 | 1,689,978 | 1,035,313,218 | 1,717,911,718 |
| වර්ෂය සඳහා ශුද්ධ අලාභය | - | - | - | - | (298,022,812) | (298,022,812) |
| වෙනත් විස්තරාත්මක ආදායම් | - | - | - | - | 8,305,315 | 8,305,315 |
| 2013.03.31 දිනට ශේෂය | 319,454,060 | 25,000,000 | 336,454,462 | 1,689,978 | 745,595,721 | 1,428,194,221 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | - | - | 140,407,657 | 140,407,657 |
| වෙනත් විස්තරාත්මක ආදායම් | - | - | - | - | 25,969,243 | 25,969,243 |
| 2014.03.31 දිනට ශේෂය | 319,454,060 | 25,000,000 | 336,454,462 | 1,689,978 | 911,972,621 | 1,594,571,121 |

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් වේ.

පිටු අංක 05 සිට 35 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අවශ්‍ය අංගයන් වේ.

**2014 ඔක්තෝම්බර් 27 දින**
**කොළඹ**

# මිල්කෝ (පුද්ගලික) සමාගම
# 2014 මාර්තු 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2014 මාර්තු 31<br>රු. | 2013 මාර්තු 31<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| බද්දට පෙර ශුද්ධ (අලාභය) / ලාභය | 161,107,096 | (267,468,281) |
| ගැලපුම්, | | |
| - දේපළ පිරියත හා උපකරණ මත ක්ෂය කිරීම | 168,039,581 | 187,612,037 |
| - දීර්ඝ කාලීනව හිඟව තිබෙන CWIP කපා හැරීම | 1,007,636 | 737,646 |
| - ආයෝජන ආදායම් | (109,023,269) | (85,582,743) |
| - පොලී වියදම් | 136,802,933 | 109,168,553 |
| - කල්බදු පොලිය | 15,799,262 | 20,075,269 |
| - විලම්බිත දීමනා මත හඳුනාගත් ආදායම | (11,134,742) | (400,600) |
| - ආපසු ගෙවිය යුතු තැන්පතු කපා හැරීම | - | (13,965,821) |
| - බොල් සහ අඩමාන ණය සඳහා ගැලපීම | 2,812,658 | 4,147,382 |
| - නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා වෙන් කිරීම පාරිතෝෂික | 69,286,483 | 62,583,184 |
| - බැහැර කළ භාණ්ඩ කපා හැරීම | 1,005,918 | 1,580,341 |
| | 274,596,460 | 285,955,248 |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය | 435,703,556 | 18,486,967 |
| තොග - (වැඩිවීම) / අඩුවීම | (61,773,428) | (63,559,646) |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබීම්වල (වැඩිවීම) / අඩුවීම | (169,246,269) | (59,621,225) |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම / (අඩුවීම) | 3,829,923 | 128,304,453 |
| | (227,189,774) | 5,123,582 |
| මෙහෙයුම් තුළින් උත්පාදනය කළ මුදල් | 208,513,782 | 23,610,549 |
| ගෙවූ පොලී | (136,802,933) | (109,168,553) |
| ගෙවූ ආදායම් බදු සහ ESC | (11,862,431) | (18,942,785) |
| ගෙවූ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික | (10,363,855) | (4,700,012) |
| | (159,029,219) | (132,811,350) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබුණු/භාවිතා වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 49,484,563 | (109,200,801) |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද මූල්‍ය ප්‍රවාහය** | | |
| දේපළ, පිරියත, උපකරණ හා CWIP අත්පත් කර ගැනීම | (155,572,481) | (46,059,294) |
| ඉදිකිරීම් හේතුකොට ගෙන දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | (18,207,868) | (59,830,668) |
| පශු සම්පත් විකිණීමෙන් ලද ආදායම | 73,800 | 146,100 |
| ලද පොලී | 109,023,269 | 85,582,743 |
| ආපසු ගත් / (නව) කෙටි කාලීන සහ දීර්ඝ කාලීන (ශුද්ධ) ආයෝජන | (145,470,272) | (49,884,275) |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය | (210,153,552) | (70,045,394) |

| | | | |
|---|---|---|---|
| මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද මූල්‍ය ප්‍රවාහය | | | |
| රජයෙන් ලද ප්‍රදාන | | - | 37,200,000 |
| ගෙවූ කල්බදු කුලිය | | (38,550,984) | (38,550,984) |
| වසර තුළ දුන් ණය | | 16,834,500 | - |
| ණය සහ ණයට ගැනීම්වලින් ආදායම (ශුද්ධ ආපසු ගෙවීම) | | (72,502,561) | (35,983,925) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය | | (94,219,045) | (37,334,909) |
| මුදල් හා මුදලට සමාන දේවල ශුද්ධ වැඩිවීම | | (254,888,034) | (216,581,104) |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදලට සමාන දේ | **සටහන අ** | (469,181,429) | (252,600,325) |
| වර්ෂය අවසනායේ දී මුදල් හා මුදලට සමාන දේ | **සටහන ආ** | (724,069,463) | (469,181,429) |

| | | |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ දී | | Note A |
| බැංකුවල ඉතිරි ශේෂය | 70,198,394 | 29,892,575 |
| අත ඇති මුදල් | 3,390,666 | 3,115,191 |
| | 73,589,060 | 33,007,766 |
| බැංකු අයිරා | (542,770,489) | (285,608,091) |
| | (469,181,429) | (252,600,325) |
| වර්ෂය අවසානයේ දී | | Note B |
| බැංකුවල ඉතිරි ශේෂය | 28,734,485 | 70,198,394 |
| අත ඇති මුදල් | 5,013,679 | 3,390,666 |
| | 33,748,164 | 73,589,060 |
| බැංකු අයිරා | (757,817,627) | (542,770,489) |
| | (724,069,463) | (469,181,429) |

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් වේ.

පිටු අංක 05 සිට 35 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අවශ්‍ය අංගයන් වේ.

**2014 ඔක්තෝබර් 27**
**කොළඹ**

1. **ගිණුම් ප්‍රතිපත්ති**

1.1 **ආයතනික තොරතුරු**

1.1.1 **නෛතික සහ නිත්‍යාවාස ස්වභාවය**

සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම යනු ශ්‍රී ලංකාවේ පිහිටා තිබෙන සංස්ථාපිත සීමාසහිත වගකීම දරණ සමාගමකි.

"සීමාසහිත ලංකා කිරියා කිරි කර්මාන්ත (පුද්.) සමාගම" ලෙස මෙම සමාගම 1996 මැයි 09 වන දින සංස්ථාගත කර ඇත. සමාගමේ නම "සීමාසහිත මිල්කෝ (පුද්.) සමාගම" ලෙස 2001 ජූලි 23 වන දින සිට වෙනස් කර ඇත. ශ්‍රී ලංකා රජය හා ඉන්දියානු ජාතික කිරි සංවර්ධන මණ්ඩලය අතර ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව, සීමාසහිත ලංකා කිරි නිෂ්පාදන සමාගමට 1998 පෙබරවාරි 3 දින වන විට අයත් වූ සහ එම සමාගම භාවිතා කළ (ඉඩම් හැර) සියලු දේපළ, පිරියත හා උපකරණවල අයිතිය සහ සීමාසහිත ලංකා කිරි නිෂ්පාදන (පුද්.) සමාගම විසින් එම දිනය වන විට භාවිතා කළ ඉඩම් හා ගොඩනැගිලිවල බදු අයිතිය, 1998 පෙබරවාරි 04 වන දින සිට සමාගම වෙත මාරු කර තිබේ. එසේ මාරු කරන ලද වත්කම්වල ශුද්ධ වටිනාකම රු. 306,500,020/-කි. තව ද 2000 අගොස්තු 08 දිනැති ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසමෙහි ලිපියට අනුව බදුගත් ඉඩම හා ගොඩනැගිලිවල වාර්ෂික කල්බදු කුලිය වන රු. 20,427,900/- මුදල, ඒකාබද්ධ ව්‍යාපාරය බවට පත් කිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කපා හැර ඇත. ඒකාබද්ධ ගිවිසුම තවදුරටත් බලාත්මක නොවුව ද එකී රජයේ ඉඩම හා ගොඩනැගිලිවලට අදාළ ගිණුම් යථා පරිදි ගැලපීමට සමාගම පියවර ගෙන නැත.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 46/56, නවම් මාවත, කොළඹ 02 යන ස්ථානයේ පිහිටා ඇති අතර, ප්‍රධාන ව්‍යාපාරික කටයුතු ද එම ස්ථානයේ සිදු කරනු ලබයි. සමාගමේ ප්‍රධාන කර්මාන්තශාලා නාරාහේන්පිට, අඹේවෙල, දිගන හා පොළොන්නරුව යන ස්ථානවල පිහිටා ඇත.

1.1.2 **ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය**

වර්ෂය තුළ දී සමාගම විසින් සිදු කළ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ කිරි එකතු කිරීම, පිරිසැකසුම, ඇසිරීම, බෙදාහැරීම හා එම නිෂ්පාදන අලෙවි කිරීමයි.

1.1.3 **නිකුත් කිරීමට බලය පැවරූ දිනය**

2014 ඔක්තෝබර් 27, අධ්‍යක්ෂ මණ්ඩලය එළඹුන තීරණය අනුව 2014 මාර්තු 31න් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට බලය පවරන ලදී.

1.1.4 **මූල්‍ය ප්‍රකාශ සඳහා වගකීම**

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම දරයි. මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම "අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය" යන කොටසෙහි දැක්වේ.

## 1.2 ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය

### 1.2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### 1.2.1.1 මූල්‍ය ප්‍රකාශ සැකසීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS)වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

#### 1.2.1.2 ගිණුම් පදනම

සාධාරණ අගය අනුව ගණන් බැලූ ඇතැම් වත්කම් සහ වගකීම් හැර මෙම මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය අනුව සකස් කර ඇත.

#### 1.2.1.3 කෘත්‍යාත්මක ව්‍යවහාර මුදල

අදාළ ස්ථිතිය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයෙහි පවත්නා ව්‍යවහාර මුදල භාවිතා කොට මූල්‍ය ප්‍රකාශනවල අඩංගු අයිතම මනිනු ලැබේ. සමාගමේ කෘත්‍යාත්මක ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මිනුම් ප්‍රකාශිත ය.

#### 1.2.1.4 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

2014 මාර්තු 31 දින වන විට සමාගමෙහි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, සවිස්තරාත්මක ආදායම පිළිබඳ ප්‍රකාශය, හිමිකම් සහ මූල්‍ය ප්‍රවාහ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශ සහ සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් (මූල්‍ය ප්‍රකාශ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS සහ SLFRS)වලට අනුකූලව සකස් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 7 දරණ සමාගම් පනතට අනුකූල ය.

#### 1.2.1.5 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්ම සඳහා සමාගමට ඇති හැකියාව සීමාසහිත මිල්කෝ (පුද්.) සමාගම විසින් ඇස්තමේන්තු කරන ලදුව, දක්නට හැකි ඉදිරි අනාගතය තුළ ව්‍යාපාර කටයුතුවල නියුතු වීමට අවශ්‍ය සම්පත් සමාගම සතු බවට සෑහීමට පත්විය. තව ද, සමාගමට අඛණ්ඩ පැවැත්මකට ඇති හැකියාව ගැන සැලකිය යුතු සැකයන් ඇති කරන වැදගත් අවිනිශ්චිතතාවක් කළමනාකාරිත්වයට දැනගන්නට නැත. එබැවින් "අඛණ්ඩ පැවැත්ම" පදනම් කොට ගෙන මූල්‍ය ප්‍රකාශ තවදුරටත් සකස් කරනු ලැබේ.

#### 1.2.1.6 සංසන්දනාත්මක තොරතුරු

ගිණුම්කරණ ප්‍රතිපත්ති නොවෙනස්ව යොදා ගෙන ඇති අතර, එම ප්‍රතිපත්ති ඉකුත් වසරේ ප්‍රතිපත්තිවලට අනුරූප ය. අවශ්‍ය තන්හි ඉකුත් වසරේ ඉලක්කම් සහ පාඨ වත්මන් වසරේ ඉදිරිපත් කිරීමට ගැලපෙන පරිදි යලි සකසා ඇත.

#### 1.2.1.7 විදේශීය මුදල් ගනුදෙනු

සියළු විදේශීය විනිමය ගනුදෙනු වාර්තා කරන ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලට, ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ පැවති විනිමය අනුපාතය අනුව හරවා ඇත.

විදේශීය මුදල්වලින් අගය දක්වා ඇති මුදල්මය වත්කම් සහ වගකීම්, වර්ෂය අවසානයේ පැවති අත්පිට විදේශ විනිමය අනුපාත යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලට හරවා ඇත. එහි ප්‍රතිඵල වශයෙන් සිදුවන ලාභ හෝ පාඩු සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි ගිණුම්ගත කර ඇත.

මුදල්මය නොවන වත්කම් සහ වගකීම් අගය නිර්ණය අවස්ථාවේ දී පැවති විනිමය අනුපාතය යොදා ගනිමින් මාරු කරනු ලැබේ. එහි ප්‍රතිඵල වශයෙන් සිදු වන ලාභ හෝ පාඩු විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි ගිණුම්ගත කර ඇත.

**1.2.1.8 ද්‍රව්‍යමයභාවය සහ සමූහනය**

සමාන අයිතම අයත් වන ද්‍රව්‍යමය පන්ති මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම දක්වා ඇත. අසමාන ස්වභාවයක් ඇති හෝ කාර්යභාරය අතින් අසමාන වන අයිතම, ඒවා ද්‍රව්‍යමය නොවන්නේ නම් වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

1.2.19 තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

අ) විනිශ්චයන්

ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගි කර ගැනීමේ දී, මූල්‍ය ප්‍රකාශනවල පිළිගත් ප්‍රමාණ කෙරෙහි සුවිශේෂී ලෙස බලපාන, ඇස්තමේන්තුවලට පරිබාහිර විනිශ්චයන්ට කළමනාකාරිත්වය එළඹී ඇත.

ආ) සමාගමේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී ආදායම, වියදම, වත්කම් සහ වගකීම් ප්‍රමාණයන් සහ වාර්තා කරන දිනය වන විට පවත්නා අසම්භාව්‍ය වගකීම් හෙළි කිරීම කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් කිරීමට කළමනාකාරිත්වයට සිදුවේ.

ඊළඟ මුදල් වර්ෂයේ දී වත්කම් සහ වගකීම්වල වටිනාකම ද්‍රව්‍යමය වශයෙන් වෙනස් කිරීමේ සුවිශේෂ අවදානමක් ඇති අනාගතය පිළිබඳ මූඛ්‍ය උපකල්පනයන් සහ මූල්‍ය තත්ත්වය ගණන් බලන දිනය වන විට පවත්නා අවිනිශ්චිතභාවය ඇස්තමේන්තු කරන ප්‍රභවයන් සැලකිල්ලට භාජන කර ඇත.

**1.3 වත්කම් සහ වත්කම් තක්සේරු කිරීමේ පදනම**

**1.3.1 දේපළ පිරියත සහ උපකරණ**

අ) මැනුම

සියළු දේපළ පිරියත සහ උපකරණ ආරම්භයේ දී පිරිවැය අනුව සටහන් කරනු ලැබේ. අනතුරුව දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන් ප්‍රති ඇගයීමේ දී එබඳු වත්කම් අයත්වන සම්පූර්ණ අයිතම පන්තිය ප්‍රති ඇගයීමට භාජනය කරනු ලැබේ.

එදිනෙදා අළුත්වැඩියා කිරීමේ පිරිවැය බැහැර කොට, සමුච්චිත ක්ෂය වීම සහ සමුච්චිත අපහරන අගය අඩු කොට දේපළ, පිරියත සහ උපකරණ පිරිවැය අනුව සටහන් කරනු ලැබේ. එම පිරිවැයට දේපළ පිරියත සහ උපකරණවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමට සිදුවන අවස්ථාවේ දී දරන්නට සිදුවන පිරිවැය පිළිගැනීමට අවශ්‍ය උපමානයන් සපුරා තිබේ නම්, ඇතුළත් කරනු ලැබේ. දේපළ පිරියත සහ උපකරණවල වැදගත් කොටස් කලින් කලට ප්‍රතිස්ථාපනය කළ යුතු නම්, සමාගම එබඳු අයිතම වෙනම වත්කම් විශේෂිත ප්‍රයෝජනවත් කාල සීමාවක් ඇති වත්කම් සේ සලකා එම අයිතම ක්ෂය කිරීමට භාජන කරනු ඇත.

විශාල පරිමාණයේ පරීක්ෂණයන් පවත්වන විට, එහි පිරිවැය පිළිගැනීමේ උපමානයන් සපුරා ඇත්නම්, දේපළ පිරියත සහ උපකරණ ප්‍රතිස්ථාපනයක් ලෙස පවත්නා අගය තුළ පිළිගැනීමට පාත්‍ර වනු ඇත. අනෙක් සියළු අළුත්වැඩියාවන් සහ නඩත්තු පිරිවැය, එම පිරිවැය දරන්නට සිදුවූවා සේ සලකා ලාභ හෝ අලාභවල දී හඳුනා ගනු ඇත.

දේපළ පිරියත හෝ උපකරණ අයිතමයන් බැහැර කිරීම හෝ එය භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් ආර්ථික ලාභයක් අපේක්ෂා නොකරන්නේ නම්, එම අයිතමය පිළිගැනීමක් නැති අයිතමයක් වනු ඇත. පිළිගැනීම බැහැර කිරීමෙන් ලැබෙන කිසියම් ලාභයක් හෝ පාඩුවක් (බැහැර කිරීමෙන් ලැබූ ආදායම සහ වත්කමෙහි පවත්නා වටිනාකම අතර වෙනස) වේ නම් එය වත්කම පිළිගැනීම අත්හිට වූ වර්ෂයේ සවිස්තරාත්මක ගිණුම් ප්‍රකාශයට ඇතුළත් කරනු ඇත.

ආ) දේපළ පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් කාලය

සෑම වාර්තා කරන දිනකටම වත්කමක ශේෂ අගය, ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේද සමාගම විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම අගයන්, අනුපාතයන් සහ ක්‍රම ඇස්තමේන්තු කිරීමේ දී වෘත්තිය විශේෂඥයන්ගේ මත අනුව කළමනාකාරිත්වය විනිශ්චයකට එළඹේ.

ඇ) ක්ෂය කිරීම

දේපළ පිරියත සහ උපකරණවල සෑම කොටසකම ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ රේඛීය පදනම මත ලබන ලාභය හෝ පාඩුව අනුව ක්ෂය වීම ගණන් ගනු ලැබේ. එසේ කරනු ලබන්නේ, වත්කමෙහි අන්තර්ගතවන අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාව, එම ක්‍රමය ඉතා සමීපව පිළිඹිබු කරන නිසාය.

මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන ඇති වත්කම් ක්ෂය කරනු ලබන්නේ කල්බදු කාල සීමාව හෝ එහි ඇස්තමේන්තුගත ජීවිත කාලය යන කාල දෙකෙන් අඩු කාලය මතය.

ආර්ථික වශයෙන් ප්‍රයෝජනවත් ඵලදායි ජීව කාලය පහත දැක්වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 20ට වැඩි |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | වසර 04 සිට 15 ට වැඩි |
| ලි බඩු හා සවිකිරීම් | වසර 03 සිට 05 ට වැඩි |
| විද්‍යාගාර උපකරණ | වසර 03 සිට 05 ට වැඩි |
| මෝටර් රථ | වසර 08 සිට 15 ට වැඩි |
| මෙවලම් හා උපකරණ | වසර 03 සිට 10 ට වැඩි |
| කාර්යාලිය උපකරණ | වසර 2.5 සිට 05 ට වැඩි |
| බෝතල් හා ඇසුරුම් භාජන | වසර 04 ට වැඩි |
| පරිගණක | වසර 02 සිට 04 ට වැඩි |
| බෝතල් සිසිල්කරණ | වසර 2.5 සිට 05 ට වැඩි |
| මෘදුකාංග | වසර 03 ට වැඩි |
| කිරි භාජන | වසර 05 ට වැඩි |

වත්කම් ක්ෂය කිරීම, එය භාවිතාවට ගන්නා අවස්ථාවේදී ම ආරම්භ වන අතර, වත්කම විකිණීම සඳහා තැබීමට වර්ගීකරණය කරනු ලබන දින සහ වත්කම් භාවිතයට නොගන්නා දින යන දින දෙකෙන් කලින් එළඹුන දින ක්ෂය කිරීම අවසන් වේ.

ඈ) ප්‍රතිෂ්ඨාපන පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණවලින් ආරම්භයේ දී අපේක්ෂිත ඇස්තමේන්තුගත කාර්යසාධනය අනාගතයේ දී පවත්වා ගැනීම සඳහා සිදු කරන ප්‍රතිසංස්කරණ සඳහා යන වියදම, එම වියදම දරන අවස්ථාවේ දී ම වියදමක් ලෙස ගිණුම්ගත කරනු ලැබේ.

**1.3.2 කල්බදු**

අ) මූල්‍ය කල්බදු - සමාගම බදු ගැණුම්කරු වන අවස්ථාවන් හි දී

හිමිකාරත්වය ලැබීමත් සමග, හිමි වු දැයට සම්බන්ධ අවදානම සහ ප්‍රතිලාභ කල්බදු ලබාගත් අයට හිමිවන කල්බදු, මූල්‍ය කල්බද්ද ලෙස වර්ග කරනු ලැබේ. සමුච්චිත ක්ෂය වීම සහ සමුච්චිත අපහරණ පාඩු අඩු කොට, සාධාරණ අගය හෝ ආරම්භයේ දී අවම කල්බදු ගෙවීම යන ප්‍රමාණ දෙකෙන් අඩු ප්‍රමාණයට සමාන සේ සලකා මූල්‍ය කල්බදු ගැනීම් ගණනය කරනු ලැබේ.

බදු හිමියාට ගෙවිය යුතු වන අනුරූප මූලික ප්‍රමාණය බැරකමක් ලෙස පෙන්නුම් කෙරේ. අනාගත කාලයන් සඳහා වෙන්කරන ලද මූල්‍ය ගාස්තු සටහන්වල වෙන් වෙන්ව පෙන්වා ඇත.

එක් එක් මුදල් වර්ෂයට අදාළ වන කලින් පැවති බැදියාවේ පොලියට එක් එක් කාලය වෙනුවෙන් පවත්නා බැර ශේෂය මත ස්ථාවර කාලවර්තන පොලි අනුපාතයන් ඇති කිරීමට, බදු කාලය මුළුල්ලේම ආදායම් ප්‍රකාශනයෙන් අයකර ගනු ලැබේ.

කල්බදු දේපළ හෝ එහි වැඩි දියුණු කිරීමට අදාළ පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලබන අතර, කල්බද්ද සම්පූර්ණ නොවු කාලය හෝ වැඩි දියුණු කිරීමෙන් තක්සේරු කළ ප්‍රයෝජන ගත හැකි ආයු කාලය යන දෙකෙන් අඩු කාලය තුළ ක්ෂය කරනු ලැබේ.

මූල්‍ය කල්බද්දකින් ඇතිවන විකිණීමක් හෝ කල්බදු ගනුදෙනුවක් සම්බන්ධ වත්කමක ඉදිරියට ගෙනා වටිනාකමට වැඩි යම් විකුණුම් අතිරික්තයක් වේ නම් බදු කාලය පුරා විලම්භනය කර ක්‍රමක්ෂය කරනු ලැබේ.

ආ) මෙහෙයුම් කල්බදු

කල්බදු කාලය යටතේ වත්කමක සියළු අවදානම් සහ ප්‍රතිලාභ කල්බදු හිමිකරු එලදායිව දරනු ලබන කල්බදු, මෙහෙයුම් කල්බදු වශයෙන් වර්ගීකරණය කරන ලදී.

මෙහෙයුම් කල්බදු යටතේ ගෙවනු ලබන කල්බදු ගෙවීම් (රක්ෂණ සහ නඩත්තු වැනි සේවා පිරිවැය හැර) සරල මාර්ගික පදනමක් මත කල්බදු කාලය පුරා ආදායම් ප්‍රකාශය තුළ වියදමක් ලෙස පෙන්වා ඇත.

**1.3.3 වත්කම් අපහරණය**

සෑම වාර්තාකරන දිනයකදී ම, කිසියම් වත්කමක් අපහරණය වීමට ඇඟවීමක් තිබේ ද යන්න සමාගම විසින් ඇස්තමේන්තු කරනු ලැබේ. එබඳු ඇඟයීමක් ඇත්නම් හෝ කිසියම් වත්කමක් වාර්ෂිකව අපහරණය සඳහා ඇස්තමේන්තු කිරීම අවශ්‍ය නම්, සමාගම එම වත්කමෙන් ආපසු ලබාගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කරයි. වත්කමක ආපසු ලබාගත හැකි ප්‍රමාණය වන්නේ වෙනත් වත්කම් හෝ වත්කම් කාණ්ඩවලින් බෙහෙවින් පරිබාහිරව, එම වත්කම මුදල් ගලා ඒමක් සිදු නොකරන්නේ නම්, අදාළ වත්කමෙහි හෝ මුදල් ජනනය කරන ඒකකයෙහි, විකුණුමට වියදම් වන පිරිවැය සහ භාවිතයේ අගය අඩු කරන ලද සාධාරණ අගයයි. වත්කමක් දරණ අගය, එම වත්කමට අදාළ ආපසු ලැබුම් අගය ඉක්මවන කළ, එම වත්කම අපහරණය වී ඇති බව නිගමනය කරන හෙයින් එහි ආපසු ලැබුම් අගය ලේඛනගත කරනු ලැබේ. භාවිතයේ පවතින අගයන් තක්සේරු කිරීමේ දී, මුදලෙහි කාල අගය, වර්තමාන වෙළෙඳ පොළ ඇස්තමේන්තුවක් මගින් පිළිබිඹු කරන පෙර බදු වට්ටම් අනුපාතයක් සහ වත්කමට විශේෂිත අවදානම භාවිතා කොට, ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලා ඒම වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ.

අපහරණයට පාත්‍ර වූ වත්කමෙහි කාර්යභාරයට අනුරූප වියදම් ගණයන් හි ආදායම් ප්‍රකාශවල අඛණ්ඩ මෙහෙයුම්වල අපහරණ පාඩු හඳුනා ගෙන ඇත.

කලින් හඳුනාගත් අපහරණ පාඩු තවදුරටත් පවති ද, එසේත් නැත්නම් අඩු වී තිබේ ද යන්න පිළිබඳ ඇඟවීමක් තිබේ ද යන වග දැන ගැනීම සඳහා සෑම වාර්තාකරන දිනකම, කීර්තිනාමය හැර සෙසු වත්කම් ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. එබඳු ඇඟවීමක් ඇත්නම්, ආපසු ලැබිය හැකි ප්‍රමාණය සමාගම විසින් ඇස්තමේන්තු කරනු ලැබේ.

ඉකුත් අපහරණ පාඩුව හඳුනාගත් දිනයෙන් පසු, වත්කම්වල ආපසු ලැබිය හැකි අගය තීරණය කිරීමට යොදාගත් ඇස්තමේන්තුවල වෙනසක් තිබේ නම් පමණක්, කලින් හඳුනාගත් අපහරණ පාඩුව ප්‍රතිවර්තනය කරනු ලැබේ. එසේ වුවහොත් වත්කම දැනට දරන අගය ආපසු ලැබිය හැකි ප්‍රමාණය දක්වා වැඩි කරනු ලැබේ. ඉකුත් වසරවල වත්කමක අපහරණය පාඩුවක් හඳුනාගෙන නොතිබුණා නම්, එසේ වැඩි කළ ප්‍රමාණය ශුද්ධ ක්ෂය වීම හැර, නිර්ණය කළා වූ වත්කම දරන අගයට වැඩි නොවනු ඇත. එබඳු ප්‍රතිවර්තනයක් විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ.

**1.3.4 දැනට ඉටුවන ප්‍රාග්ධන වැඩ**

වත්කම ප්‍රථම වරට උපයෝජනයට යොදවන විට, දැනට ඉටුවන ප්‍රාග්ධන වැඩ අදාළ වත්කම් ගිණුමට මාරු කරනු ලැබේ.

**1.3.5 මූල්‍ය වත්කම්**

පහත සඳහන් වර්ගවලට සමාගම තම වත්කම් වර්ග කෙරේ: ලාභය හා අලාභය මගින් සාධාරණ අගයක් ඇති මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු දෑ, විකිණීමට ඇති සහ කල්පිරීම දක්වා තබා ගන්නා මූල්‍ය වත්කම්. මූල්‍ය වත්කම් ලබා ගැනීමට හේතු වූ කරුණු මත වර්ග කිරීම රඳා පවතී. ආරම්භක හඳුනා ගැනීමේ දී මූල්‍ය වත්කම්වල වර්ගීකරණය කළමනාකාරිත්වය තීරණය කරන අතර, මෙම වර්ග නාමය වාර්තාකරණ හැම දිනකදීම නැවත ඇගයීමට පාත්‍ර කරයි.

**1.3.5.1 ආරම්භක හඳුනා ගැනීම සහ මැනීම**

ආරම්භක හඳුනා ගැනීමේ දී සමාගම තම මූල්‍ය වත්කම් වර්ගීකරණය නිර්ණය කරයි. ආරම්භයේ දී සියළු මූල්‍ය වත්කම් සාධාරණ අගය සමග හඳුනාගනු ලැබේ. සාධාරණ අගය රහිත වත්කම් සෘජුවම ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය සහ ලාභ අලාභ අනුව හඳුනාගනු ලැබේ.

වෙළෙඳ පොළ සම්ප්‍රදාය සහ නියෝග මගින් නියමිත කාල රාමුවක් තුළ භාරදිය යුතු මූල්‍ය වත්කම් මිලට ගෙන හෝ විකුණා ඇත්නම් ඒවා විකිණීම හෝ මිලට ගැනීම සිදු වූ දිනයේ දී හඳුනාගනු ඇත. එනම් වත්කම මිලට ගැනීමට හෝ විකිණීමට සමාගම එකඟ වූ දිනය යි.

මුදල්, ස්ථිර තැන්පතු සහ වෙළෙඳාමෙහි සහ වෙනත් ලැබිය යුතු දේවල ආයෝජන සමාගමේ මූල්‍ය වත්කම්වලට ඇතුළත් වේ.

### 1.3.5.2 පසුගණන මිනුම

මූල්‍ය වත්කම්වල පසුගණන මිනුම එම වත්කම්වල වර්ගීකරණය මත පහත සඳහන් අයුරු සිදුවේ.

(අ) ලාභය සහ අලාභය අනුව සාධාරණ අගයක් ඇති මූල්‍ය වත්කම්:

විකිණීම සඳහා තබාගත් මූල්‍ය වත්කම් සහ ලාභ, අලාභ මගින් ආරම්භයේ දී සාධාරණ අගය මත හඳුනාගත් මූල්‍ය වත්කම්, ලාභ හා අලාභ මගින් සාධාරණ අගය දරන මූල්‍ය වත්කම් ලෙස සැලකේ. විකිණීම සඳහා හෝ නුදුරු අනාගතයේ දී නැවත මිලට ගැනීම සඳහා ලබාගත් මූල්‍ය වත්කම් විකිණීමට තබාගත් මූල්‍ය වත්කම් ලෙස වර්ග කරනු ලැබේ.

(ආ) ණය සහ ලැබිය යුතු දෑ

ක්‍රියාකාරී වෙළෙඳ පොළෙහි මිල ගණන් නොදැක් වූ ස්ථිර නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ණය හෝ ලැබිය යුතු දෑ හැටියට හැඳින් වේ. ආරම්භක මැනීමෙන් පසු එබඳු මූල්‍ය වත්කම්, අපහරණය අඩු කොට ඵලදායී පොළී අනුපාත ක්‍රමය අනුගමනය කරමින් ක්‍රමක්ෂය පිරිවැයට පසුව මනිනු ලැබේ. අත්පත් කර ගැනීමේ දී සහ ඵලදායී පොළී අනුපාතයේ අවියෝජනීය කොටසක් මත ගෙවීම් සහ පිරිවැයට ලැබෙන වට්ටමක් හෝ ආධිමිල සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය පිරිවැය ගණන් බලනු ලැබේ. විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායමට ඵලදායී පොළී අනුපාත ක්‍රමක්ෂය වීම ඇතුළත් කරනු ලැබේ. විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැයෙහි අපහරණය නිසා සිදුවන පාඩු හඳුනාගනු ලැබේ.

(ඇ) කල්පිරීම දක්වා තබා ගන්නා ආයෝජන

ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් හෝ නිශ්චය කළ හැකි ස්ථිර කල්පිරීම් සහිත ගෙවීම්, කල්පිරීම දක්වා තබා ගැනීමට සමාගමට නියත අභිලාශයක් ඇත්නම්, ඒවා කල්පිරීම දක්වා තබා ගන්නා වත්කම් හැටියට වර්ග කරනු ලැබේ. ආරම්භක මැනීමෙන් පසු, කල්පිරීම දක්වා තබාගන්නා ආයෝජන, ඵලදායී පොළී අනුපාත ක්‍රමය භාවිතා කොට අපහරණය සඳහා අඩු කිරීමෙන් පසු ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ. අත්පත් කර ගැනීමේ දී ලැබුණ වට්ටම් හෝ ආධිමිල සහ ඵලදායී පොළී අනුපාතයේ අවියෝජනීය කොටස් වන ගෙවීම් සහ පිරිවැය ගණන් ගැනීමෙන් ක්‍රමක්ෂය පිරිවැය ගණන් බලනු ලැබේ. විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට ඵලදායී පොළී අනුපාත ක්‍රමක්ෂය වීම ඇතුළත් ය. විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයෙහි අපහරණය නිසා සිදුවන පාඩු හඳුනා ගනු ලැබේ.

(ඈ) විකුණුම සඳහා ඇති ආයෝජන

විකුණුම් සඳහා ඇති මූල්‍ය ආයෝජනවලට හිමිකම් සහ ණය සුරැකුම් ඇතුළත් ය. වෙළඳාම සඳහා තබාගත් හෝ ලාභ හෝ අලාභ අනුව සාධාරණ අගය ඇති හැටියට වර්ග කර නැති විකුණුම් සඳහා ඇති ආයෝජන හිමිකම් ආයෝජන හැටියට වර්ග කරනු ලැබේ. මෙම ගණයට අයත් ණය සුරැකුම් වන්නේ, අවිනිශ්චිත කාලයක් සඳහා තබා ගැනීමට අදහස් කරන සහ ද්‍රවශීලතා අවශ්‍යතාවලට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළෙඳ පොළ වෙනස් වීම්වලට ප්‍රතිචාර වශයෙන් විකිණීමට ඉඩ ඇති සුරැකුම් ය.

ආරම්භක මැනීමෙන් පසු විකිණීමට ඇති මූල්‍ය වත්කම් සාධාරණ අගයට පසුව මනිනු ලැබේ.

ලබානොගත් ලාභ සහ පාඩු හිමිකම්වල (වෙනත් විස්තරාත්මක ආදායම) "විකිණීමට ඇති සංචිතය" තුළ සෘජුවම හඳුනාගනු ලැබේ. ආයෝජනයක් බැහැර කිරීමෙන් පසු හිමිකම්වල කලින් හඳුනාගත් සමුච්චිත ලාභය හෝ පාඩුව වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ. එකම සුරැකුම මත ආයෝජනයකට වැඩියෙන් සමාගම සතුවන කළ ඒවා "පළමුව ඇතුළට පළමුව පිටතට" යන පදනම මත බැහැර කරනු ඇතැයි අපේක්ෂිත ය. විකිණීමට ඇති මූල්‍ය වත්කම් ළඟ තබාගන්නා විට එමගින් උපයන පොලිය ඵලදායී පොලී අනුපාතය යොදාගත් පොලී ආදායම ලෙස වාර්තා කරනු ලැබේ. විකිණීමට ඇති මූල්‍ය ආයෝජන ළඟ ලබාගත් කල ලැබෙන ලාබාංශ ගෙවීමට ඇති අයිතිය පිළිගත් පසු විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි "වෙනත් මෙහෙයුම් ආදායම්" ලෙස හඳුනාගනු ලැබේ. එබඳු ආයෝජන අපහරණය වීම නිසා සිදුවන පාඩුව, විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි 'මූල්‍ය ආයෝජන අපහරණය මත පාඩු' වශයෙන් හඳුනාගනු ලබන අතර, "විකිණීමට ඇති සංචිතයෙන්" එම ආයෝජන ඉවත් කරනු ලැබේ.

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් කෙටි කාලීනව විකිණීමට ඇති හැකියාව සහ අභිලාශය යෝග්‍ය ද යන වග විමසීමට සමාගම විකිණීමට ඇති වත්කම් ඇගයීමක් සිදු කරයි. ක්‍රියාශීලී නොවන වෙළෙඳ පොළ නිසා මෙම මූල්‍ය වත්කම් විකිණීමට සමාගමට නොහැකි වන කල සහ විකිණීමට කළමනාකාරිත්වයෙහි අභිප්‍රාය දැකිය හැකි අනාගතයට තුළ වෙනස් වන කල, දුර්ලභ තත්ත්වයන් යටතේ මෙම මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීමට සමාගම කැමති වනු ඇත. මූල්‍ය වත්කම් ණය සහ ලැබිය යුතු දේවල නිර්වචනයට යෝග්‍ය වන කල සහ කල්පිරීම දක්වා මෙම වත්කම් පෙර දැකිය හැකි අනාගතය තුළ තබා ගැනීමට අභිලාශය සහ හැකියාව සමාගමට ඇති කල, ණය සහ ලැබිය යුතු දෑ හැටියට නැවත වර්ග කිරීමට අවසර ඇත. කල්පිරීම දක්වා තබාගත් වර්ගට හැටියට නැවත වර්ග කිරීම, සමාගමට එම වත්කම එලෙස තබාගැනීමට අභිලාශය සහ හැකියාව ඇත්නම් පමණක් සිදු කළ හැක.

විකිණීම සඳහා ඇති වර්ගයක් ප්‍රතිවර්ගීකරණයට භාජන කිරීමෙන් පසු පවතින මූල්‍ය වත්කමක් සඳහා, හිමිකම්වල හඳුනාගත් එම වත්කමට පෙරාතුව ලැබුණු පාඩුවක් හෝ ලාභයක් වේ නම්, එය ඵලදායී පොලී අනුපාතය භාවිතා කොට ආයෝජනයේ ඉතිරි ජීවිත කාලය සඳහා ක්‍රමක්ෂය කරනු ලැබේ. නව ක්‍රමක්ෂය පිරිවැය සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහය අතර වෙනස ද, වත්කමෙහි ඉතිරි ජීවිත කාලය සඳහා ඵලදායී පොලී අනුපාතය උපයෝගී කොට ගෙන ක්‍රමක්ෂය කරනු ලැබේ. අනතුරුව වත්කම අපහරණය වූ බව නිර්ණය වේ නම්, හිමිකම්වල වාර්තා වූ ප්‍රමාණය ප්‍රතිවර්ගීකරණය කොට විස්තරාත්මක ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

### 1.3.5.3 හඳුනාගත් තත්ත්වයෙන් බැහැර වීම

මූල්‍ය වත්කමක් (හෝ අදාළ තන්හි මූල්‍ය වත්කමෙන් කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයකින් කොටසක්) හඳුනාගත් තත්ත්වයෙන් බැහැර කිරීම පහත සඳහන් තත්ත්වයන් යටතේ සිදුවේ.

අ) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය නැති වීම.

ආ) සමාගම වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය මාරු කළ අවස්ථාවක හෝ ලැබුණ මුදල් ප්‍රවාහ සම්පූර්ණයෙන් ම කිසිදු ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශ්වයකට ගෙවීම "හරහා ගමන් කිරීමේ" වැඩපිළිවෙළක් තුළ බැඳීමක් ලෙස බාර ගැනීම සහ වත්කමෙහි සියළු අවදානම් ප්‍රතිඵල සහ පරිදානයන් සමාගම විසින් මාරු කර තිබීම හෝ වත්කමෙහි සියළු අවදානම් ප්‍රතිඵල සහ පරිදාන මාරු කිරීමක් හෝ ළඟ තබා ගැනීමක් සමාගම විසින් සැලකිය යුතු ලෙස සිදුකර නැති නමුත්, වත්කමෙහි පාලනය මාරුකර ඇති කල, සමාගම විසින් වත්කමෙන් ලැබෙන මුදල්

ප්‍රවාහවල මාරු කිරීම හෝ "හරහා ගමන් කිරීමේ" එකඟත්වයකට එළඹ ඇති කල සහ වත්කමෙහි සියළු අවදානම් ප්‍රතිඵල සහ ප්‍රතිදාන සැලකිය යුතු ලෙස මාරු කිරීම හෝ ළඟ තබා ගැනීම ද, පාලනය ද නොකර වත්කමට අඛණ්ඩ ආකූලිත බව පවතින තාක්දුරට වත්කම පිළිගැනීම යන කරුණු පවතී නම් සමාගම ආශ්‍රිත වගකීම පිළිගනී. මාරු කළ වත්කම සහ ආශ්‍රිත වගකීම සමාගම ඉතිරි කරගෙන ඇති අයිතිවාසිකම් සහ බැඳීම් පිළිඹිබු වන අයුරින් මනිනු ලැබේ.
මාරු කළ වත්කම පිළිබඳ සහතික වීමක් ලෙස පවතින අඛණ්ඩ ආකූලිත බව පවතින කල්හී වත්කමෙහි මුල් වටිනාකම සහ සමාගමට ආපසු ගෙවීමට අවශ්‍ය උපරිම වටිනාකම යන ප්‍රමාණ දෙකෙන් අඩු ප්‍රමාණය එම වත්කමෙහි වටිනාකම ලෙස මනිනු ලැබේ.

### 1.3.5.4 මූල්‍ය වත්කම් අපහරණය වීම

සමාගම සෑම වාර්තා කරන දිනයක දීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අපහරණය වී ඇද්ද යන්න ගැන විෂය මූලික සාක්ෂි තිබේ ද යන කාරණය ඇස්තමේන්තු කරයි. වත්කම ආරම්භයේ දී හඳුනා ගැනීමෙන් පසු ඇති වූ සිදුවීම් එකක හෝ කිපයක ප්‍රතිඵල වශයෙන් (අලාභ ගෙන දෙන සිදුවීමක්) අපහරණය සිදු වී ඇති බවට විෂය මූලික සාක්ෂි ඇත්නම්, සහ එම අලාභ ගෙන දෙන සිදුවීම මූල්‍ය වත්කමෙහි හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයෙහි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ කෙරෙහි විශ්වාස කටයුතු ලෙස ඇස්තමේන්තු කළ හැකි බලපෑමක් වේ නම්, මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අපහරණය වී ඇති බව සිතිය හැක. ණයකරුවන් හෝ ණයකරුවන් කණ්ඩායමක් පොළිය හෝ මුල් මුදල ගෙවීම පිළිබඳ දුෂ්කරතාවයක්, පැහැර හැරීමක් හෝ යුතුකම් නොසලකා හැරීමක් හෝ පැහැර හැරීම් සමග සහ සම්බන්ධ වන ආර්ථික තත්ත්වයන් හෝ හිඟ මුදල්වල වෙනස්වීම් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල මැනිය හැකි අඩුවීම් පවතින බව, නිරීක්ෂණය කළ හැකි දත්ත පෙන්නුම් කිරීම, බංකොලොත් - භාවය හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට පිවිසීමේ විභව්‍යතාවක් පැවතීම වැනි දර්ශක අපහරණය දක්වන සාක්ෂිවලට ඇතුළත් විය හැක.

#### ක්‍රමක්ෂය පිරිවැය වට්ටමෙහි මූල්‍ය වත්කම් පැවතීම

ක්‍රමක්ෂය පිරිවැය මට්ටමෙහි පවත්නා මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සමාගම පළමුව තනි තනිව සුවිශේෂ වන්නා වූ මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් තනි තනිව අපහරණය වීමක් පවතී ද යන වග හෝ තනි තනිව සුවිශේෂි නොවන මූල්‍ය වත්කම් සඳහා සාමූහිකව අපහරණය පවතී ද යන වග පරීක්ෂා කර බලයි. සුවිශේෂ ලෙස හෝ එසේ නොවන තනි තනිව ඇස්තමේන්තු කළ මූල්‍ය වත්කමකට අපහරණය පිළිබඳ විෂය මූලික සාක්ෂි නැති බව සමාගම නිර්ණය කරයි නම්, සමාගම විසින් එම වත්කම සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කාණ්ඩයකට ඇතුළත් කොට එම වත්කම් සාමූහිකව අපහරණය සඳහා ඇස්තමේන්තු කරයි. අපහරණය සඳහා තනි තනිව ඇස්තමේන්තු කරන ලද වත්කම් සඳහා අපහරණය දැනට හා මින් මතුවට ද පවතින බව හඳුනා ගෙන ඇත්නම් එබඳු වත්කම් සාමූහිකව අපහරණය ඇස්තමේන්තු කිරීමට ඇතුළත් කරනු නොලැබේ.

අපහරණ පාඩු සිදුව ඇති බවට විෂය මූලික සාක්ෂි ඇත්නම්, වත්කමෙහි පවත්නා වටිනාකම සහ ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහ (දැනටමත් සිදුව නැති අනාගතයේ දී අපේක්ෂිත ණය පාඩු හැර) අතර වෙනස ලෙස සිදුව ඇති පාඩුව මනිනු ලැබේ. ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහවල ප්‍රවර්තන අගය, මූල්‍ය වත්කමෙහි ආරම්භක පොළී අනුපාතය පරිදි වට්ටම් කරනු ලැබේ. ණයකට වෙනස්වන පොළී අනුපාතයක් ඇත්නම් කවර අපහරණ පාඩුවක් වුව ද, මැන බැලීම සඳහා වට්ටම් අනුපාතය වන්නේ ප්‍රවර්තන ක්‍රියාත්මක පොළී අනුපාතය යි.

අනුදත් ගිණුමක් භාවිතා කොට එමගින් වත්කමක පවත්නා අගය අඩු කරන අතර පාඩුව විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ. අඩු කළ පවත්නා අගය මත පොළිය උපචිත වීම අඛණ්ඩව සිදුවන අතර, උපචිත කිරීම අපහරණ පාඩුව ගණන් බැලීම සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට යොදා ගත් පොළී අනුපාතය අනුව සිදු කෙරේ. පොළී ආදායම මූල්‍ය ආදායමෙහි කොටසක් ලෙස විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි වාර්තා කරනු ලැබේ. ණය අනාගතයේ දී ආපසු ලබා ගැනීමේ යථාර්ථවාදී බලාපොරොත්තුවක් ඇතිව සියළු ඇප ලැබී තිබීම හෝ සමාගමට මාරු කර ඇති තත්ත්වයක් තුළ පොත්වලින් ඉවත් කරනු ලැබේ. තදනන්තර වර්ෂයක දී, ඇස්තමේන්තුගත අපහරණ පාඩුව,

අපහරණය හඳුනාගත් පසු සිදුවීමක් නිසා වැඩි වීම හෝ අඩු වීම සිදු වුවහොත් ඉඩහැරීමේ ගිණුම ගැලපීමෙන් කලින් හඳුනාගත් අපහරණ පාඩුව අඩු කරනු ලැබේ, එසේත් නැත්නම් වැඩි කරනු ලැබේ. අනාගතයේ දී පොත්වලින් ඉවත් කිරීමත්, පසුව ආපසු ලැබුණහොත් ආපසු ලැබුම විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැයට බැර කරනු ලැබේ.

**විකිණීමට ඇති මූල්‍ය වත්කම්**

විකිණීමට ඇති මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, සමාගම සෑම වාර්තාකරන දිනකදීම, ආයෝජනයක් හෝ ආයෝජන සමූහයක් ක්‍රමක්ෂය වී ඇති බවට විෂය මූලික සාක්ෂි තිබේ ද යන වග ඇස්තමේන්තු කර බල යි. විකිණීමට ඇති යනුවෙන් වර්ගීකරණය කර ඇති හිමිකම් ආයෝජන සම්බන්ධයෙන්, පිරිවැයට අඩු සාධාරණ අගයේ සුවිශේෂී දීර්ඝකාලීන අඩු වීමක් වෙතොත් එය විෂය මූලික සාක්ෂිවලට ඇතුළත් වනු ඇත. ආයෝජනයේ ආරම්භක පිරිවැය සමග "සුවිශේෂී" යන්න අගයන අතර ආරම්භක අගයට අඩුවෙන් සාධාරණ අගය පැවති කාලය "දීර්ඝකාලීන" යන්න අගයනු ලැබේ. ක්‍රමක්ෂය වීමක් පැවති බවට සාක්ෂි ඇති කල, සමුච්චිත පාඩුව - අත්පත් කරගත් පිරිවැයේ සහ ප්‍රවර්තන සාධාරණ අගය, අඩු කළ විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි කලින් හඳුනාගත් එම ආයෝජනයෙහි ක්‍රමක්ෂය පාඩුව අතර වෙනස ලෙස ගණන් බලන ලද - වෙනත් විස්තරාත්මක වියදම්වලින් ඉවත් කොට විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ. හිමිකම් ආයෝජනවල උපචය පාඩු විස්තරාත්මක ආදායම් ප්‍රකාශය මගින් ප්‍රතිවර්තනය නොකෙරේ, ක්‍රමක්ෂයට පසු එම වත්කම්වල සාධාරණ අගයෙහි වැඩි වීම් වෙනත් විස්තරාත්මක ආදායමෙහි සෘජුවම හඳුනාගනු ලැබේ.

විකිණීමට ඇති යනුවෙන් වර්ග කර ඇති ණය මෙවලම් සම්බන්ධයෙන්, ක්‍රමක්ෂය පිරිවැයට පවත්නා මූල්‍ය වත්කම්වලට අදාළ උපමානවලට සමාන ආකාරයට ක්‍රමක්ෂය ඇස්තමේන්තු කරනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය සහ ප්‍රවර්තන සාධාරණ අගය අතර වෙනස අඩු කළාම එම ආයෝජනය මත පෙරාතුව විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගත් අපහරණ පාඩුව ලෙස මනින ලද සමුච්චිත පාඩුව අපහරණය ලෙස වාර්තා වූ ප්‍රමාණය වේ.

අපහරණ පාඩුව මැනීම සඳහා අනාගත මූල්‍ය ප්‍රවාහ වට්ටම් කිරීමට යොදා ගන්නා පොළී අනුපාතය යොදා ගනිමින් වත්කමෙහි අඩු කළ ප්‍රවර්තන අගය පදනම් කොට ගෙන අනාගත පොළී ආදායම සමුච්චිත කිරීම අඛණ්ඩව සිදුවේ. පොළී ආදායම මූල්‍ය ආදායමෙහි කොටසක් ලෙස වාර්තා කරනු ලැබේ. තදනන්තර වර්ෂයක දී ණය මෙවලමෙහි සාධාරණ අගය වැඩි වේ නම්, එම වැඩි වීම විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි අපහරණ පාඩුව හඳුනා ගැනීමෙන් පසු සිදුවීමකට විෂය මූලිකව සම්බන්ධ කළ හැකි නම්, අපහරණ පාඩුව විස්තරාත්මක ආදායම් ප්‍රකාශය මගින් ප්‍රතිවර්තන කළ හැක.

### 1.3.6 මූල්‍ය වගකීම්

යෝග්‍ය පරිදි ලාභය හා අලාභය මගින් හෝ වෙනත් මූල්‍ය වගකීම් මගින් සමාගම තම මූල්‍ය වගකීම් සාධාරණ අගය මත මූල්‍ය වත්කම් හැටියට වර්ග කරයි. වාර්තා කරන දිනය වන විට ලාභය සහ අලාභය මගින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් නොවී ය.

### 1.3.6.1 ආරම්භක හඳුනාගැනීම සහ මැනීම

සියළු මූල්‍ය වගකීම් ආරම්භයේ දී සාධාරණ අගය මත හඳුනා ගනු ලැබේ. මෙයට සෘජුව ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරවැය ඇතුළත් ය. ණය දීම සහ ණය ගැනීම් ද, වෙළෙඳාම සහ වෙනත් ගෙවිය යුතු දෑ ද, බැංකු අයිරා ද, සමාගමේ මූල්‍ය වගකීම්වලට ඇතුළත් ය.

### 1.3.6.2 පසුගණන මැනීම

පහත සඳහන් පරිදි මූල්‍ය වගකීම් මැනීම, ඒවා වර්ග කිරීම මත රඳාපවතී.

අ) ලාභය සහ අලාභය මගින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම්.

වෙළෙඳාමට තබා ගන්නා මූල්‍ය වත්කම් සහ ලාභය සහ අලාභය මගින් සාධාරණ අගය මත පවතින හැටියට ආරම්භක හඳුනා ගැනීමේ දී නම් කරන ලද මූල්‍ය වගකීම්, ලාභය සහ අලාභය මගින් සාධාරණ අගය මත පවත්නා මූල්‍ය වගකීම්වලට ඇතුළත් ය. ආසන්න කාලීනව විකිණීම සඳහා මූල්‍ය වගකීම් අත්පත් කර ඇත්තේ නම්, වෙළෙඳාම සඳහා තබාගත් මූල්‍ය වගකීම් හැටියට එම වගකීම් වර්ග කරනු ලැබේ.

ආ) වෙනත් මූල්‍ය වගකීම්

ආරම්භක හඳුනා ගැනීමෙන් පසු, අනෙක් මූල්‍ය වගකීම්, ඵලදායි පොළී අනුපාත ක්‍රමය භාවිතා කොට ක්‍රමක්ෂය පිරිවැය මත පසුගණන මනිනු ලැබේ. වගකීම් හඳුනා ගැනීමෙන් බැහැර කරන විට ලාභ සහ අලාභ විස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ. තව ද, ඵලදායි පොළී අනුපාත ක්‍රමක්ෂය ක්‍රියාවලිය මගින් ද එය සිදුකරනු ලැබේ. අත්පත් කර ගැනීමේ දී ලැබෙන වට්ටම හෝ ආධිපත්‍යය සහ ඵලදායි පොළී අනුපාතයේ අවියෝජනීය අගයන් වන ගෙවීම් සහ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණන් බලනු ලැබේ. ඵලදායි පොළී අනුපාත ක්‍රමක්ෂය වීම විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැයට ඇතුළත් කරනු ලැබේ.

**1.3.6.3 නැවත හඳුනා ගැනීම**

මූල්‍ය බැඳීමක් යටතේ ඇති අවශ්‍යයෙන් කළ යුතු දේ ඉටු කිරීම හෝ අවලංගු කිරීම හෝ කල් ඉකුත් වීම නිසා, එම මූල්‍ය බැඳීම හඳුනා ගැනීමෙන් බැහැර වේ. පවත්නා මූල්‍ය වගකීමක් එම ණය දෙන්නා විසින්ම වෙනත් සැලකිය යුතු කොන්දේසි මත තවත් වගකීමක් මගින් ප්‍රතිස්ථාපනය කළ විට හෝ පවත්නා වගකීමට අදාළ කොන්දේසි සැලකිය යුතු ලෙස වෙනස් කළ විට එබඳු මාරු කිරීම හෝ වෙනස් කිරීම ආරම්භක වගකීම හඳුනාගැනීමෙන් වැළකී නව වගකීමක් හඳුනාගැනීමක් හැටියට සලකන අතර අදාළ වටිනාකම් අතර වෙනස විස්තරාත්මක ආදායම් ප්‍රකාශවල හඳුනාගනු ලැබේ.

**1.3.6.4 මූල්‍ය මෙවලම් හිලව් කිරීම**

හඳුනාගත් ප්‍රමාණයන් හිලව් කිරීමට නෛතික අයිතියක් ඇත්නම් සහ ශුද්ධ පදනමක් මත බේරුම් කිරීමට අභිප්‍රායක් හෝ වත්කම් ලබා ගැනීමට සහ එකවර වගකීම් බේරුම් කිරීමට අභිප්‍රායක් ඇත්නම් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කොට ශුද්ධ ප්‍රමාණය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කරනු ලැබේ.

**1.3.7 බඩු තොග**

කල්පැන සෙමෙන් විකිණෙන අයිතම සඳහා සුදුසු ඉඩහැරීමෙන් පසු, පිරිවැය සහ විකිණීමෙන් ලබාගත හැකි ශුද්ධ අගය අතරින් අඩු අගය මත බඩු තොග මනිනු ලැබේ. සම්පූර්ණ කිරීම සඳහා පිරිවැය සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය අඩු කොට සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී බඩු තොග විකිණිය හැකි මිල විකිණීමෙන් ලද හැකි ශුද්ධ අගය හැටියට සලකනු ලැබේ.

බඩු තොග දැනට පවත්නා ස්ථානයට, තත්ත්වයට ගෙන ඒමට දරන පිරිවැය පහත සඳහන් පිරිවැය සූත්‍රය භාවිතා කොට ගණන් බලනු ලැබේ.

අමුද්‍රව්‍ය - බර තැබූ සාමාන්‍ය පදනම මත නිර්ණය කළ පිරිවැය
නිමි භාණ්ඩ - සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රම පිරිවැය සහ සාමාන්‍ය ධාරිතාව මත තිරණය කළ පිරිවැයට
ඉටුවන කාර්යයන් - යෙදවුම් ද්‍රව්‍යවල පිරිවැය මත
ඇසුරුම් ද්‍රව්‍ය - බර තැබූ සාමාන්‍ය පදනම මත නිර්ණය කළ පිරිවැය
වෙනත් තොග - බර තැබූ සාමාන්‍ය පදනම මත නිර්ණය කළ පිරිවැය
මාර්ගස්ථ භාණ්ඩ - සත්‍ය පිරිවැය මත

**1.3.8 වෙළෙඳාම සහ වෙනත් ලැබිය යුතු දෑ**

වෙළෙඳාමෙන් ලැබිය යුතු දෑ ආරම්භයේ දී සාධාරණ අගය මත හඳුනාගනු ලැබේ. තදනන්තරව, කලින් සිදු වූ අපහරණය අඩු කළ ඵලදායි පොළී අනුපාතය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය මත මනිනු ලැබේ.

අනෙක් ලැබිය යුතු දෑ, ඉකුත් අපහරණයන් අඩු කොට, ඒවායින් ලබාගත හැකි ආදායම් ප්‍රමාණය මත හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදන ප්‍රමාණය විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ. කෙසේ වුව ද, සමාගමට අදාළ නොවැළැක්විය හැකි හේතු නිසා කාර්යමණ්ඩල ණය ක්‍රමක්ෂය පිරිවැය මත මනිනු ලබන්නේ නැත.

**1.3.9 මුදල් සහ මුදල්වලට සමාන දෑ**

මුදල් සහ මුදල්වලට සමාන දෑ හැටියට පහත සඳහන් දෑ ඇතුළත් ය: අත ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු ලෙස බැංකුවල ඇති තැන්පතු, ආරම්භක ත්‍රෛමාසික කල්පිරීම සහිත කෙටිකාලීන බෙහෙවින් ද්‍රවශීල ආයෝජන. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වගකීම් තුළ බැංකු අයිරාවන් දක්වා තිබේ.

**1.3.10 ප්‍රකාශිත ප්‍රාග්ධනය**

(අ) වර්ගීකරණය

මුදල් හෝ වෙනත් වත්කම් මාරු කිරීමට බැඳීමක් නැති කල, අභිමත ලාභාංශ සහිත සාමාන්‍ය කොටස් හිමිකම් ලෙස වර්ග කරනු ලැබේ.

(ආ) ලාභාංශ

ලාභාංශ ලැබීමට කොටස් හිමියන් සතු අයිතිය ස්ථාපිත වූ කල ලාභාංශ හඳුනාගනු ලැබේ. හිමිකම් කොටස් හිමියන්ට අතුරු ලාභාංශ ගැන සලකා බලන කල, එය සිදුවන්නේ අධ්‍යක්ෂවරුන් ප්‍රකාශයට පත් කළ පසුය. අවසාන ලාභාංශ ගැන සලකන කල එය සිදු වන්නේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී කොටස් හිමියන් විසින් අනුමත කළ පසුව ය.

**1.3.11 වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ**

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී ලබාගත් සේවාවන් සඳහා ගෙවීමට ඇති බැඳීම වෙළෙඳ ගෙවිය යුතු දෑ හැටියට සැලකේ. වර්ෂයක් හෝ ඊට අඩු කාලයක් තුළ ගෙවිය යුතු වේ නම් ඒවා ජංගම වගකීම් හැටියට වර්ග කරනු ලැබේ, එසේ නැතහොත් ඒවා ජංගම නොවන වගකීම් ලෙස ඉදිරිපත් කෙරේ.

ආරම්භයේ දී සාධාරණ අගය මත වෙළෙඳ ගෙවිය යුතු දෑ හඳුනාගන්නා අතර පසුව ඵලදායී පොළී ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය මත මනිනු ලැබේ. ප්‍රකාශිත පොළී අනුපාතයක් රහිත කෙටි කාලීන ගෙවිය යුතු දෑ වට්ටම් කිරීමෙහි බලපෑමක් නැති හෙයින්, ආරම්භක ඉන්වොයිස් ප්‍රමාණය අනුව මනිනු ලැබේ.

**1.3.12 ප්‍රදාන සහ සහනාධාර**

අදාළ පිරිවැයට ගැලපෙන කාල පරිච්ඡේදයක් තුළ ප්‍රදාන සහ සහනාධාර ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ. ක්‍රමානුකූල පදනමක් මත එම පිරිවැය සඳහා හානිපූර්ණයක් කිරීම මෙහි අරමුණයි.

සාධාරණ අගය මත ලබාදෙන මූල්‍ය ප්‍රදාන ඇතුළුව, වත්කම් ආශ්‍රිත ප්‍රදාන, ශේෂ පත්‍රයෙහි විලම්භිත කරන අතර, ආශ්‍රිත වත්කමෙහි ප්‍රයෝජනවත් කාල සීමාව තුළ ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ.

ආදායම් ආශ්‍රිත ප්‍රදාන ලැබිය යුතු කාල සීමාව තුළ ආදායම් ප්‍රකාශයට ඇතුළත් වේ.

**1.3.13 වර්තමාන සහ විලම්භිත බදු**

(අ) දේශීය ආදායම් කොමසාරිස්ගෙන් අයකර ගැනීමට හෝ ඔහුට ගෙවීමට අපේක්ෂිත ප්‍රමාණය මත වර්තමාන සහ ඉකුත් කාල පරිච්ඡේද සඳහා වර්තමාන ආදායම් බදු වත්කම් සහ වගකීම් මනිනු ලැබේ.

ආදායම් ප්‍රකාශයෙහි වාර්තා කරන ලද සහ 2004 අංක 10 දරණ දේශීය ආදායම් පනත අනුව ගණන් බලන ලද ආදායම් සහ වියදමේ අංගෝපාංග මත ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම් වී ඇත.

(ආ) විලම්භිත බදු

ශේෂ පත්‍ර දිනට වත්කම් සහ බැරකම්වල බදු පදනමට සහ තාවකාලික මූල්‍ය වාර්තාකරණය සඳහා ඒවා දරණ අගය අතර තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රමය භාවිතා කරමින් විලම්භිත බදු වෙන් කරන ලදී.

සියළු තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් සහ බැරකම් හඳුනාගෙන ඇත. අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සහ ඉදිරියට ගෙන ආ භාවිතයට නොගත් බදු බැර සහ

භාවිතා නොකළ අලාභ වෙනුවෙන් යොදාගත හැකි බදු අය කළ හැකි ලාභයක් පවතින තාක්දුරට, සියළු අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්, ඉදිරියට ගෙන ආ භාවිතා නොකළ බදු බැර සහ භාවිතා නොකළ බදු අලාභ සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාගනු ලැබේ.

ඉදිරියට ගෙන ආ විලම්භිත බදු වත්කම් එක් එක් ශේෂ පත්‍ර දිනට සමාලෝචනය කරනු ලබන අතර, භාවිතා කළ හැකි විලම්භිත බදු වත්කම්වලින් සියල්ල හෝ කොටසකට ඉඩ දිය හැකි ප්‍රමාණවත් බදු ගෙවිය හැකි ලාභයක් තව දුරටත් නොවේ යයි අනුමාන කරන ප්‍රමාණයට අඩු කරනු ලැබේ. එක් එක් ශේෂ පත්‍ර දිනට විලම්භිත බදු වත්කම් නැවත තක්සේරු කරන අතර, අයකර ගත යුතු විලම්භිත බදු වත්කම්වලට ඉඩ දෙනු ලබන අනාගත බදු ගෙවිය යුතු ලාභය බවට පත්විය හැකි ප්‍රමාණයෙන් හඳුනා ගනු ලැබේ.

ශේෂ පත්‍ර දිනය වන විට පනවා ඇති හෝ පැනවීමට නියමිත බදු අනුපාත හෝ බදු නීති පදනම් කොට ගෙන, වත්කම් උපලබ්ධි කරනු ලබන හෝ බැරකම් නිරවුල් කරන වර්ෂයට යොදා ගනු ඇතැයි අපේක්ෂිත බදු අනුපාත අනුව විලම්භිත වත්කම් සහ බැරකම් ගණනය කරනු ලැබේ.

සමාන කොටස්වල සෘජුවම හඳුනාගත් අයිතමයන්ට අදාළ ආදායම් බදු සමාන කොටස් තුළ හඳුනාගෙන ඇත.

වර්තමාන බදු වත්කම්, බදු බැරකම් සඳහා හිලව් කිරීමට නීත්‍යානුකූල අයිතියක් තිබේ නම් හා විලම්භිත බද්ද එකම බදු අයකළ හැකි වස්තුවකට සහ එකම බදු අධිකාරියකට අදාළ වේ නම්, විලම්භිත බදු වත්කම් විලම්භිත බදු බැරකම්වලට හිලව් කරනු ලැබේ.

**1.3.14 ආශ්‍රිත පාර්ශ්ව සමග ගනුදෙනු**

ගෙවීමට ඇති මිල ගැන නොසලකා අනෙක් පාර්ශ්වයන්ගේ මූල්‍ය සහ මෙහෙයුම් තීරණ / ප්‍රතිපත්ති පාලනය කිරීමට සුවිශේෂී බලපෑම් කිරීමට හැකි වූ ගනුදෙනු ගැන හෙළිදරව් කර ඇත. ආශ්‍රිත පාර්ශ්ව අතර ගනුදෙනු තිබුණ ද යන වග නොසලකා මව් සහ සහාය සංවිධාන අතර සබඳතා හෙළිදරව් කරනු ඇත.

**1.3.15 සේවක ප්‍රතිලාභ**

(අ) අර්ථදැක් වූ ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

1983 අංක 12 දරණ පාරිතෝෂික / LKAS 19 අනුව විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලස්වා ඇත. වගකීම සඳහා බාහිර අරමුදල් ලබා නැත. සිදුකළ ආයුගණක ඇගයීම පදනම් කොට පාරිතෝෂික වගකීම් ගණන් බලන ලදී. ආයුගණක ලාභ හෝ පාඩු සිදුවුන කාලයේ වෙනත් විස්තරාත්මක ආදායම් ප්‍රකාශයට භර කිරීම හෝ බැර කිරීම සිදුවිය.

සමාගමේ විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම Messis Actnarial & Management Consultants (Pvt.) Ltd. ආයතනය විසින් ඉටුකළ ආයුගණක ඇගයීම් පදනම් කරගනී. ආයු ගණක බැඳීම් වට්ටම් අනුපාත සහ අනාගත වැටුප් වැඩිවීම් පිළිබඳ උපකල්පන ඇසුරු කරයි. ඇගයීමේ සංකීර්ණත්වය යටින් දිවෙන උපකල්පන සහ දීර්ඝකාලීන ස්වභාවය යන උපකල්පනවල වෙනස්වීම්වලට අර්ථ දැක් වූ ප්‍රතිලාභ බැඳීම් බෙහෙවින් සංවේදී වේ. සෑම උපකල්පනයක් ම වාර්තා කරන සෑම දිනක දීම සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුවල දී භාවිතා කළ මූඛ්‍ය උපකල්පනවල විස්තර 30 වන පිටුවේ අංක 22 දරණ සටහනෙහි දැක්වේ. මුඛ්‍ය උපකල්පන මර්ත්‍යතාව, ආබාධිතත්ව අනුපාත සහ ඉවත් වීමේ අනුපාත ආශ්‍රිතය. අවසන් විශ්‍රාමික වැටුප් අනුපාතය නිර්ණය සඳහා වට්ටම් අනුපාතය සහ වැටුප් අනුපාතය තීරණාත්මක ය.

(ආ) අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

සේවකයන්ට සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි අනුව, හිමිකම් ඇත. සමාගම සේවකයන්ගේ මුළු පාරිශ්‍රමිකයෙන් පිළිවෙළින් 12%ක් සහ 3%ක් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවයි.

**1.3.16 ප්‍රතිපාදන**

අතීත සිදුවීම් හේතු කොට ගෙන සමාගමට නෛතික හෝ ගිවිසුම්ගත බැඳීමක් සමාගමට ඇත්නම් වෙන්කිරීම් හඳුනාගනු ලැබේ. බැඳීම් නිරවුල් කිරීමට සම්පත් පිටත ගලායාමක් අවශ්‍ය විය හැකි අතර, ප්‍රමාණය විශ්වාස කටයුතු ලෙස ඇස්තමේන්තු කර ඇතැයි සිතිය හැකිය. අනාගත මෙහෙයුම් අලාභ සඳහා ප්‍රතිපාදන හඳුනාගෙන නැත.

සමාන බැඳීම් රාශියක් පවතින කල, එම බැඳීම් කාණ්ඩයක් පූර්ණ වශයෙන් සැලකිල්ලට ගෙන, නිරවුල් කිරීම සඳහා පිටත ගලායාමක් අවශ්‍ය වීමේ ඉඩ තිබිය හැකි බව නිර්ණය කරනු ලැබේ. එකම බැඳීම් කාණ්ඩයක කවර එක් අයිතමයක් සම්බන්ධයෙන් වුව ද, පිටත ගලා යාමට ඇති ඉඩ කුඩා විය හැකි වුවත්, ප්‍රතිපාදනය හඳුනාගනු ලැබේ.

**1.3.17 බැඳීම්**

වාර්තාකරන දිනයට පැවති සියළු ද්‍රව්‍යමය බැඳීම් හඳුනාගෙන ඇති අතර ඒවා මූල්‍ය ප්‍රකාශනයට සැපයූ සටහන්වල හෙළිකර ඇත.

**1.3.18 ආදායම් හඳුනා ගැනීම**

සමාගමේ සාමාන්‍ය කටයුතුවල දී ඉටු කළ සේවය සඳහා ලැබුණ හෝ ලැබිය යුතු ගෙවීමෙහි සාධාරණ අගය ආදායම වේ. පිරිවැටුම ආශ්‍රිත බ්‍රෝකර් ගාස්තු, විකිණීමේ වියදම් සහ වෙනත් අය කිරීම් අඩු කළ ශුද්ධ මිල ගණන් අගය මත ආදායම වාර්තා කරනු ලැබේ.

(අ) භාණ්ඩ විකිණීම

ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලායනු ඇතැයි සිතිය හැකිතාක් දුරට සහ ආදායම් සහ දරන්නට සිදු වූ ආශ්‍රිත පිරිවැය පිළිගත හැකි දුරට මිනිය හැකි වන කල් හි ආදායම හඳුනාගනු ලැබේ. වෙළෙඳ වට්ටම් සහ විකුණුම් බදු අඩු කොට ලැබුණ හෝ ලැබිය හැකි ආදායමෙහි සාධාරණ අගය මත ආදායම ගණනය කරනු ලැබේ. සුවිශේෂී අවදානම් සහ පරිදාන ගැණුම්කරුට මාරු කොට ලැබිය යුතු ගෙවීම ගැන විශ්වාසය තැබිය හැකි සහ ආශ්‍රිත පිරිවැය සහ භාණ්ඩ ආපසු එවීමේ ඉඩ, පිළිගත හැකි මට්ටමට ඇස්තමේන්තු කළ හැකි කල්හි ආදායම හඳුනාගනු ලැබේ.

(ආ) පොළී ආදායම

එලදායී පොළී ක්‍රමය පදනම් කරගෙන පොළී ආදායම හඳුනාගනු ලැබේ.

(ඇ) ලාභාංශ ආදායම

ගෙවීම ලැබීමේ අයිතිය ස්ථාපිත වූ පසු ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

**1.3.19 වියදම**

උපචිත පදනම මත වියදම් හඳුනාගනු ලැබේ. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී සහ දේපළ පිරියත සහ උපකරණ කාර්යක්ෂම මට්ටමෙන් පවත්වා ගැනීමේ දී දරන්නට සිදුවන සියළු වියදම් වර්ෂයේ ප්‍රතිඵල ගණනය සඳහා ආදායමෙන් අය කරනු ලැබේ.

විස්තරාත්මක ආදායම් තොරතුරු ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා වියදම් වර්ගීකරණය කිරීමට කාර්යය අනුව වියදම් ක්‍රමය අනුගමනය කරන ලදී.

2. නිකුත් කර ඇතත් තවම ක්‍රියාත්මක නොවූ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවල බලපෑම

නිකුත් කළ නමුත් සමාගමේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කළ දිනය දක්වා ක්‍රියාත්මක නොවූ ප්‍රමිති සහ අර්ථකථන පහත හෙළිකරනු ලැබේ. මෙම ප්‍රමිති අදාළ නම් ක්‍රියාත්මක වූ පසු ඒවා අනුගමනය කිරීමට සමාගම අදහස් කරයි.

අ) SLFRS 9 - මූල්‍ය මෙවලම් : වර්ගීකරණය සහ මැනීම

SLFRS 9 නිකුත් කර ඇති පරිදි LKAS 39 ප්‍රතිස්ථාපනය කිරීමේ පළමු අදියර පිළිඹිබු කරන අතර, LKAS 39 මගින් අර්ථකථනය කර ඇති පරිදි මූල්‍ය වත්කම් සහ වගකීම් වර්ගීකරණයට සහ මැනීමට අදාළ වේ. 2012 වර්ෂයේ දී SLFRS 9 නිකුත් කර ඇති අතර, 2015 ජනවාරි 01 දින සිට ආරම්භ වන මූල්‍ය වකවානු සඳහා ක්‍රියාත්මක වේ. ඒ අනුව 2016 මාර්තු 31න් අවසන් වන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ SLFRS 9 අනුව සකස් වනු ඇත. මෙහි ප්‍රතිඵල සමාගම විසින් යථා කාලයේ දී ප්‍රමාණ කරනු ඇත.

ආ) SLFRS 10 - ඒකාබද්ද මූල්‍ය ප්‍රකාශන

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණය ගැන කරුණු දැක්වෙන ඒකාබද්ධ සහ වෙන්කළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ LKAS 27ට ඇතුළත් කොටස් වෙනුවට SLFRS 10 යොදා ගැනීමට අදහස් කෙරේ. SIC 12 - විශේෂ කාර්යය ස්කන්ධ ඒකාබද්ධ කිරීම යන වගන්තිවල ඇතුළත් ගැටළු ද SLFRS 10 විසින් අමතනු ලබයි. විශේෂ කාර්යය ස්කන්ධ ඇතුළු සියළු ස්කන්ධවලට බලපාන ඒකායන පාලන මොඩලයක් SLFRS 10 ස්ථාපනය කරයි. කවර ස්කන්ධයක් පාලනය කරනු ලබන්නේ ද යන වග සහ LKAS 27 අවශ්‍යතා සමග සැසඳීමේ දී කවර මූලකාරකයක් මගින් ඒකාබද්ධ කිරීම අවශ්‍ය වන්නේ ද යන්න නිර්ණය කිරීම සඳහා සුවිශේෂී විනිශ්චයක යෙදීමට SLFRS 10 මගින් හඳුන්වා දුන් වෙනස්කම් විසින් කළමනාකාරිත්වය මෙහෙයවනු ලබයි. SLFRS 10 2012 දී හඳුන්වා දී ඇති අතර, එය 2015 ජනවාරි 01 සිට හෝ ඉන්පසු ආරම්භ වන මූල්‍ය වකවානු සඳහා බලපැවැත් වේ. ඒ අනුව 2014 මාර්තු 31න් අවසන් වන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ SLFRS 10 අනුව සකස් වනු ඇත. සමාගම බලපෑම යථා කාලයේ දී ප්‍රමාණ කරනු ඇත.

ඇ) SLFRS 11 - බද්ධ විධිවිධාන

LKAS 31 - බද්ධ ව්‍යාපාර පිළිබඳ උනන්දුව සහ SIC 13 - ඒකාබද්ධව පාලනය කරන ස්කන්ධ, ව්‍යාපාර විසින් දායක වන මූල්‍ය නොවන දෑ - වෙනුවට SLFRS 11 හඳුන්වා දී ඇත. සමානුපාතික ඒකාබද්ධකරණය යොදා ගනිමින් බද්ධ පාලනයට යටත් ස්කන්ධවලට වගඋත්තර කීමේ විකල්පය SLFRS 11 විසින් ඉවත් කරනු ලබයි. ඒ වෙනුවට බද්ධ ව්‍යාපාරයක නිර්වචනයට අනුරූප වන බද්ධ පාලනයට යටත් ස්කන්ධ සම්බන්ධයෙන් හිමිකම් ක්‍රමය භාවිතා කොට වගඋත්තර කිව යුතු ය. සමානුපාතික බද්ධ ක්‍රමය යටතේ හඳුනාගත් බද්ධ ව්‍යාපාර විධිවිධාන දැනට සමාගම සතු නැත.

ඈ) SLFRS 12 - වෙනත් ස්කන්ධ සම්බන්ධ බැඳියාවක් ගැන හෙළිකිරීම්

ඒකා බද්ධ මූල්‍ය ප්‍රකාශන ආශ්‍රිතව LKAS හි පැවති සියළු හෙළිකිරීම් ද, LKAS 31 සහ LKAS 28 හි කලින් ඇතුළත්ව තුබූ සියළු හෙළිකිරීම් ද, SLFRS 12 තුළ ඇතුළත් ය. උපාංග බද්ධ විධිවිධාන, සහායකයන් සහ ව්‍යුහගත ස්කන්ධ කෙරෙහි ස්කන්ධගේ බැඳියාවන් හෙළිදරව් කිරීම්

ඇසුරු කරයි. නව හෙළිදරව් කිරීම් රැසක්ම අවශ්‍ය නමුත්, ඒවා සමූහයෙහි මූල්‍ය තත්ත්වය හෝ කාර්යසාධනය බලපෑමක් ඇති නොකරයි. SLFRS 12 2012 දී නිකුත් කර ඇති අතර, එය 2015 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන මූල්‍ය වකවානු සඳහා බලපැවැත් වේ. මේ අනුව 2016 මාර්තු 31න් අවසන් වන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ SLFRS 12 අනුව සම්පාදනය වනු ඇත.

ඉ) SLFRS 13 - සාධාරණ අගය මැනීම

සියළු සාධාරණ අගය මැනීම් සඳහා SLFRS යටතේ ඒකායන මගපෙන්වීමක් SLFRS 13 ස්ථාපනය කරයි. කිසියම් ස්කන්ධයකට සාධාරණ අගය භාවිතා කිරීම අවශ්‍ය වන කල්හි SLFRS 13 වෙනස් වන්නේ නැත; නමුත් සාධාරණ අගය යොදා ගැනීමට අවසර ලද කල්හි SLFRS යටතේ සාධාරණ අගය මනින ආකාරය ගැන මගපෙන්වීමක් එමගින් ලැබේ. 2014 ජනවාරි 01 දින හෝ ඉන්පසු වසරක වකවානු සඳහා මෙම ප්‍රමිතිය බලපැවැත් වේ. මෙ අනුව 2015 මාර්තු 31න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ SLFRS 13 අනුව සම්පාදනය වනු ඇත. මෙම ප්‍රමිතිය පූර්ණ වශයෙන් අධ්‍යයනය කරන තුරු එහි මූල්‍ය බලපෑම දැනගැනීම හෝ සාධාරණ ලෙස ඇස්තමේන්තු කිරීම අපහසු ය.

| | | 2013/2014 | 2012/2013 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **3.** | ආදායම | | |
| | දළ විකුණුම් | 7,163,030,124 | 6,515,562,857 |
| | අඩු කළා - ජාතිය ගොඩනැගීමේ බද්ද | (143,260,601) | (130,328,961) |
| | | 7,019,769,523 | 6,385,233,896 |
| **4.** | අනෙකුත් ආදායම් | | |
| | අපහරණ විකුණුම් | 821,217 | 493,313 |
| | කුලී ආදායම | - | 21,200 |
| | දඩ සහ අධි අය | 1,593 | - |
| | උපලබ්ධි නොවූ චෙක්පත්වලට අධි අය | - | 528,783 |
| | ආපසු නොගෙවන තැන්පතු | 195,500 | 381,100 |
| | ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු | 505,000 | 398,000 |
| | විලම්භිත ආදායම - රජයෙන් ප්‍රදාන | 9,203,742 | 400,600 |
| | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 1,672,500 | 1,987,000 |
| | අනියම් ආදායම් | - | 184,641 |
| | විනිමය වාසි | 17,239,931 | - |
| | ආපසු දෙන තැන්පතු කපා හැරීම | - | 13,965,821 |
| | විකිණිය නොහැකි භාණ්ඩ විකිණීම | 141,458 | - |
| | ස්ථාවර වත්කම් විකිණීමෙන් ලාභය | 1,246,312 | - |
| | ගව ආහාර ඉපැයුම් | 2,540,466 | - |
| | | 33,567,719 | 18,360,458 |
| **5.** | මූල්‍ය ආදායම් | | |
| | ඇමතුම්/ස්ථාවර තැන්පතු මත පොලිය - දේශීය | 74,019,582 | 51,718,612 |
| | ස්ථාවර තැන්පතු මත පොලිය - විදේශීය මුදල් (USD) | 28,778,464 | 26,230,774 |
| | කාර්යමණ්ඩලය ණය සඳහා පොලිය | 6,225,223 | 7,633,357 |
| | | 109,023,269 | 85,582,743 |
| **6.** | මූල්‍ය පිරිවැය | | |
| | මූල්‍ය කල්බදු මත පොලී | 15,799,262 | 20,075,269 |
| | හුවමාරු අලාභ | - | 1,059,325 |
| | ණය සඳහා පොලී | 73,553,282 | 61,860,546 |
| | බැංකු අයිරා සඳහා පොලී | 63,249,651 | 47,308,007 |
| | | 152,602,195 | 130,303,147 |

**7.** බද්දට පෙර ලාභ / (පාඩු)

පහත සඳහන් දෑ ඇතුළත්ව සියළු වියදම් අය කිරීමෙන් පසුව බදුවලට පෙර ලාභ / (පාඩු) ප්‍රකාශිතය

| | 2013/2014 | 2012/2013 |
|---|---|---|
| අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික | 14,111,973 | 12,361,514 |
| විගණන සේවා | | |
| - අභ්‍යන්තර විගණන සේවා | 3,843,489 | 3,908,631 |
| - බාහිර විගණන සේවා | 603,750 | 525,000 |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීම | 168,039,581 | 187,612,037 |
| ජාතිය ගොඩනැගීමේ බදු වියදම | 143,260,601 | 130,328,960 |
| ප්‍රචාරණ සහ අලෙවි ප්‍රවර්ධන වියදම | 79,012,976 | 69,143,273 |
| පරිත්‍යාග | 35,200 | 217,000 |
| නීති වියදම් සහ වෘත්තියමය ගාස්තු | 4,972,742 | 3,556,404 |
| අපහරණය සඳහා ප්‍රතිපාදන | 2,812,658 | 4,147,382 |
| පිළිසකර කිරීම් සහ නඩත්තු වියදම් | 37,335,057 | 28,769,455 |
| කාර්යමණ්ඩල පිරිවැය | | |
| - වැටුප්, වේතන සහ ආශ්‍රිත වියදම් | 665,658,924 | 679,579,143 |
| - නිශ්චිත දායක මුදල් සැලසුම් අනුව ගෙවීම - සේ.නි.අ. සහ සේ.අ.අ. | 49,969,436 | 64,129,105 |
| - නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් අනුව වියදම් - පාරිතෝෂික | 32,953,388 | 49,577,857 |

| | | 2013/2014 Rs. | 2012/2013 Rs. |
|---|---|---|---|
| **8.** ආදායම් බදු වියදම් | **Note** | | |
| පවත්නා ආදායම් බදු ප්‍රතිපාදන | **8.1** | 14,604,554 | 10,697,242 |
| වර්ෂය සඳහා විලම්භිත බදු වියදම් | **20** | 6,094,885 | 19,857,289 |
| | | 20,699,439 | 30,554,531 |

**8.1** පවත්නා බදු වියදම්/(ආදායම්) සහ ගිණුම්කරණ (අලාභ) ලාභ ඉපැයුම අතර සැසඳීම

| | 2013/2014 Rs. | 2012/2013 Rs. |
|---|---|---|
| බද්දට පෙර ගිණුම්කරණ ලාභය / (පාඩුව) | 166,376,900 | (289,717,497) |
| අඩු කළා: වෙන් වෙන්ව සලකන ලද ආදායම | (109,023,269) | (83,967,966) |
| වෙළෙඳ හෝ ව්‍යාපාරයෙන් ලද ලාභය / (පාඩුව) | 57,353,631 | (373,685,463) |
| අඩු කළා: බදු සඳහා නිදහස් කරන ලද වියදම | (57,353,631) | - |
| බද්දට යටත් වන ව්‍යාපාර (පාඩුව) / ලාභය | - | (373,685,463) |
| නිදහස් කරන ලද අනෙක් ආදායම් | 28,778,464 | 26,806,689 |
| වගකිව යුතු වෙනත් ආදායම් | 80,244,805 | 58,776,054 |
| බදු අනුපාත | 28% | 28% |
| අයකළ හැකි ලාභය හෝ ආදායම මත බදු | 22,468,545 | 16,457,295 |
| 32 වගන්තිය යටතේ අඩු කිරීමෙහි බදු බලපෑම | (7,863,991) | (5,760,053) |
| ගැලපුම් ආදායම් මත බද්ද 28% බැගින් | 14,604,554 | 10,697,242 |

**8.2** විදේශීය ආයෝජනවලින් ලද ආදායම (විදේශීය මුදල්වලින් ස්ථිර තැන්පතු) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විධිවිධාන මත බද්දෙන් නිදහස් කරනු ලැබේ.

**9.** සාමාන්‍ය කොටසක් සඳහා ඉපැයුම් (පාඩුව)

කොටසක මූලික ඉපැයුම (පාඩුව) ගණනය කිරීම සමාගමේ සාමාන්‍ය කොටස්කරුවන් සඳහා ආරෝපිත ශුද්ධ ලාභය / (අලාභය) බරතබන ලද නිකුත් කළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවෙන් බෙදීම මත පදනම් වේ

| | 2013/2014 Rs. | 2012/2013 Rs. |
|---|---|---|
| සාමාන්‍ය කොටස්වලට හිමි ශුද්ධ ලාභය / (අලාභය) | 140,407,657 | (298,022,812) |
| සාමාන්‍ය කොටස්වල බරතැබූ සාමාන්‍ය සංඛ්‍යාව | 31,945,406 | 31,945,406 |
| | 4.40 | (9.33) |

**9.1** අඩු ඉපැයුම් ලැබිය හැකි කොටසක් වෙනුවෙන් ඉපැයුම (අලාභය)

සමාගම සතු අඩු ඉපැයුම් ලැබිය හැකි සාමාන්‍ය කොටස් නැති බැවින් කොටසක අඩු විය හැකි ඉපැයුම් (පාඩු) ප්‍රමාණය, ඉහත සඳහන් කොටසක මූලික පාඩු ප්‍රමාණයම වේ.

## 10. දේපළ, පිරියත හා උපකරණ

| වත්කම් විස්තරය | පිරිවැය/ඇගයීම 2013.04.01 දිනට ශේෂය | පිරිවැය/ඇගයීම එකතු කිරීම | පිරිවැය/ඇගයීම තැන්පතු | පිරිවැය/ඇගයීම 2014.03.31 දිනට ශේෂය | ක්ෂය වීම 2013.04.01 දිනට ශේෂය දිනට ශේෂය | ක්ෂය වීම වර්ෂය සඳහා අය කිරීම් | ක්ෂය වීම බදු ඉඩම්වලින් මාරු කිරීම | ක්ෂය වීම තැන්පතු මත | ක්ෂය වීම 2014.03.31 දිනට ශේෂය | අඩුවෙන් සඳහන් වටිනාකම 2014.03.31 දිනට ශේෂය | අඩුවෙන් සඳහන් වටිනාකම 31.03.2013 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **සින්නක්කර** | | | | | | | | | | | |
| ඉඩම් | 3,250,000 | - | | 3,250,000 | - | - | - | - | - | 3,250,000 | 3,250,000 |
| ගොඩනැගිලි | 139,545,642 | - | - | 139,545,642 | 37,296,042 | 6,586,204 | - | - | 43,882,246 | 95,663,396 | 102,249,600 |
| පිරියත හා යන්ත්‍ර | 1,226,878,080 | 133,982,822 | - | 1,360,860,902 | 291,289,237 | 99,693,305 | - | - | 390,982,542 | 969,878,360 | 935,588,843 |
| ලි බඩු හා සවිකිරීම් | 28,287,933 | 2,550,926 | - | 30,838,859 | 20,472,846 | 3,307,115 | - | - | 23,779,961 | 7,058,898 | 7,815,087 |
| විද්‍යාගාර උපකරණ | 32,168,586 | 2,504,636 | - | 34,673,222 | 26,528,766 | 2,862,934 | - | - | 29,391,700 | 5,281,522 | 5,639,820 |
| මෝටර් වාහන | 113,999,722 | - | (950,000) | 113,049,722 | 69,341,013 | 12,113,551 | - | (950,000) | 80,504,564 | 32,545,158 | 44,658,709 |
| මෙවලම් සහ උපකරණ | 192,457,301 | 5,183,828 | - | 197,641,129 | 162,353,642 | 12,425,997 | - | - | 174,779,639 | 22,861,490 | 30,103,659 |
| බෝතල් සහ ඇසුරුම් පෙට්ටි | 232,201,199 | 23,867,677 | - | 256,068,876 | 204,383,400 | 16,069,909 | - | - | 220,453,309 | 35,615,567 | 27,817,799 |
| පරිගණක උපකරණ | 19,233,181 | 475,900 | - | 19,709,081 | 13,708,576 | 3,183,598 | - | - | 16,892,174 | 2,816,907 | 5,524,605 |
| පරිගණක මෘදුකාංග | 2,587,209 | - | - | 2,587,209 | 2,587,209 | - | - | - | 2,587,209 | - | - |
| බෝතල් ශීතකය | 55,834,314 | 31,764,705 | (68,312) | 87,530,707 | 45,886,198 | 8,560,265 | - | (68,312) | 54,378,151 | 33,152,556 | 9,948,116 |
| කාර්යාල උපකරණ | 4,977,820 | 647,534 | | 5,625,354 | 3,663,924 | 763,964 | - | | 4,427,888 | 1,197,466 | 1,313,896 |
| කිරි භාජන | 45,547,623 | 3,552,103 | - | 49,099,726 | 39,491,104 | 2,472,739 | - | - | 41,963,843 | 7,135,883 | 6,056,519 |
| | 2,096,968,610 | 204,530,131 | (1,018,312) | 2,300,480,429 | 917,001,957 | 168,039,581 | - | (1,018,312) | 1,084,023,226 | 1,216,457,203 | 1,179,966,653 |

### 10.1 ප්‍රත්‍යාගණනය

සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම සතු ගොඩනැගිලි, බෝතල් හා ඇසුරුම් පෙට්ටි, පරිගණක මෘදුකාංග, කිරි භාජන හැර සෙසු වත්කම් වරලත් ආගණන තක්සේරුකරු එස්.එන්. විජේපාල (ආගණන ඩිප්ලෝමාධාරී) CT, B.Sc වතු කළමනාකරණ, M.Sc (නාගරික ඉඩම් තක්සේරු) විසින් 2008 අප්‍රේල් මස ප්‍රත්‍යාගණනයට භාජන කරන ලදුව සමස්ත අගය රු. 500,409,271/-ක් වීම හේතුවෙන් ඇති වූ රු. 336,454,462/-ක් වූ අතිරික්තය ප්‍රත්‍යාගණන ගිණුමට බැර කරන ලදී. ප්‍රත්‍යාගණනය සංචිතය 2009 මාර්තු 31 දිනට ගිණුම්ගත කර ඇති බැවින් වර්ෂයේ ක්ෂය අයකිරීම සඳහා බලපෑමක් ඇත.

**11.** කාර්යයේ නියුතු ප්‍රාග්ධන වැඩ

| | 2013.04.01 දිනට ශේෂය රු. | වර්ෂය තුළ දැරූ වියදම් රු. | වර්ෂය තුළ ප්‍රාග්ධනීකරණය රු. | විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙන් අඩු කරන ලදී රු. | 2014.03.31 දිනට ශේෂය රු. | 2013.03.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|---|---|
| අප ජල පිරියම් යන්ත්‍රාගාරය ඉදිකිරීම | 16,345,529 | - | - | | 16,345,529 | 16,345,529 |
| කරලියද්ද - සිවිල් ඉදිකිරීම් (පුද්.) ඉඩම | 25,936 | - | 25,936 | - | - | 25,936 |
| බඩල්ගම නව කිරි කම්හල ඉදිකිරීම | 318,530 | - | - | - | 318,530 | 318,530 |
| පදියතලාව අලෙවිසැල ඉදිකිරීම | 4,398,559 | - | 4,398,559 | - | - | 4,398,559 |
| ජල ශිතකරණ යන්ත්‍රාගාරය ස්ථාපිත කිරීම - DMF | 10,413,780 | - | 10,413,780 | - | - | 10,413,780 |
| ජල ශිතකරණ යන්ත්‍රාගාරය ස්ථාපිත කිරීම - PMF | 10,413,780 | - | 10,413,780 | - | - | 10,413,780 |
| ඉලුප්පදිවේනයි අලෙවිසැල ඉදිකිරීම | 4,180,864 | - | 4,180,864 | - | - | 4,180,864 |
| ගොඩනැගිල්ලක් ඉදිකිරීම - දිගන | 426,492 | - | - | - | 426,492 | 426,492 |
| UHT, අමතර කොටස් සහ සිවිල් ඉදිකිරීම් - DMF | - | 19,065,504 | 19,050,504 | - | 15,000 | - |
| ශිතකරණ මධ්‍යස්ථානය ඉදිකිරීම | 474,227 | - | 474,227 | - | - | 474,227 |
| ගැටඹේ අලෙවිසැල ඉදිකිරීම | - | 150,000 | - | - | 150,000 | - |
| දැනට ඉවුවන UHT වැඩ | 1,007,636 | | | 1,007,636 | - | 1,007,636 |
| **කල්බදු දේපල ස්ථාපනය - පොළොන්නරුව කිරි කම්හල** | | | | | - | |
| යෝගට් මිශ්‍ර කරන යන්ත්‍රාගාරය | 104,177,780 | - | - | - | 104,177,780 | 104,177,780 |
| | 152,183,113 | 19,215,504 | 48,957,650 | 1,007,636 | 121,433,331 | 152,183,113 |

| | | 2014 මාර්තු 31 දිනට රු. | 2013 මාර්තු 31 දිනට රු. |
|---|---|---|---|
| **12.** පශු සම්පත් | | | |
| ගව ආහාර සහ ආදර්ශ ගොවිපල | | 86,000 | 159,800 |
| | | 86,000 | 159,800 |
| **13.** බඩු තොගය | | | |
| අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය | 13.1 | 215,240,035 | 182,088,400 |
| දැනට ඉටුවන වැඩ | | 5,018,370 | 896,652 |
| නිමි භාණ්ඩ | | 136,443,063 | 153,817,169 |
| පාරිභෝජන භාණ්ඩ | 13.2 | 259,673,901 | 210,092,458 |
| මාර්ගස්ථ භාණ්ඩ | 13.3 | 1,020,970 | 9,734,150 |
| බඩු තොගය සඳහා ප්‍රතිපාදන | 13.4 | (11,352,785) | (11,352,785) |
| | | 606,043,554 | 545,276,044 |
| **13.1** අමුද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍ය | | | |
| අමුද්‍රව්‍ය - කිරිපට්ටි නිෂ්පාදන | | 94,518,011 | 44,190,176 |
| අමුද්‍රව්‍ය - ගව ආහාර | | - | 3,527,438 |
| ඇසුරුම් ද්‍රව්‍ය - කිරිපට්ටි නිෂ්පාදන | | 98,735,776 | 119,130,015 |
| අමුද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍ය - ගව ආහාර | | 3,016,521 | 2,091,109 |
| අමු කිරි තොගය | | 15,429,537 | 9,106,374 |
| බෙහෙත් සහ වෙනත් තොග | | 3,540,190 | 4,043,288 |
| | | 215,240,035 | 182,088,400 |
| **13.2** පාරිභෝජන භාණ්ඩ | | | |
| සාමාන්‍ය ගබඩාව | | 23,791,258 | 15,889,133 |
| ඉංජිනේරු ගබඩාව | | 196,087,408 | 162,505,439 |
| මෝටර් ගබඩාව | | 10,688,894 | 10,398,539 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් ගබඩාව | | 14,238,814 | 16,896,089 |
| කිරි භාජන තොගය | | 14,867,527 | 4,403,258 |
| | | 259,673,901 | 210,092,458 |
| **13.3** මාර්ගස්ථ භාණ්ඩ | | | |
| මාර්ගස්ථ නිමි භාණ්ඩ | | - | 4,386,474 |
| සාමාන්‍ය ගබඩාව | | 455,254 | - |
| මාර්ගස්ථ විද්‍යාගාර උපකරණ | | 125,798 | 125,798 |
| මාර්ගස්ථ අමුකිරි | | - | 4,372,474 |
| යෝගට් මුහුන් | | 439,918 | 849,404 |
| | | 1,020,970 | 9,734,150 |
| **13.4** බඩු තොග සඳහා වෙන්කිරීම් | | | |
| ඇසුරුම් ද්‍රව්‍ය | | (9,420,229) | (10,082,202) |
| සාමාන්‍ය ගබඩාව | | (213,355) | (213,355) |
| ඉංජිනේරු ගබඩාව | | (1,648,307) | (986,334) |
| ඉන්ධන ගබඩාව | | (70,894) | (70,894) |
| | | (11,352,785) | (11,352,785) |

**13.5** මූල්‍ය ආයතනවලින් විවිධ ආධාර ලබා ගැනීම සඳහා සුරැකුම් වශයෙන් තබා ඇති බඩු තොග මෙම මූල්‍ය ප්‍රකාශවල අංක 31 දරණ සටහනෙහි දක්වා ඇත.

| | | 2013/2014 රු. | 2012/2013 රු. |
|---|---|---|---|
| **14.** වෙළෙඳ සහ අනෙකුත් ලැබීම් | | | |
| වෙළෙඳ ණයගැතියෝ | 14.1 | 616,395,079 | 499,064,480 |
| ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දේ | 14.2 | 389,373,433 | 389,032,305 |
| වෙනත් ණයගැතියෝ | 14.3 | 15,341,226 | 8,345,078 |
| අත්තිකාරම්, තැන්පතු සහ පෙර ගෙවීම් | | 76,579,174 | 67,228,738 |
| කාර්යමණ්ඩලයට ලබාදුන් ණය | 14.4 | 159,243,687 | 136,860,659 |
| ආනයන පාලනය | | 14,762,660 | 9,141,492 |
| ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොලී | | 39,765,936 | 35,364,832 |
| ඩබ්.එච්.ටී. ලැබීම් | | 10,493,879 | 10,493,879 |
| වෙනත් ලැබිය යුතු දේ | | 10,000 | - |
| | | 1,321,965,074 | 1,155,531,463 |
| **14.1** වෙළෙඳ ණයගැතියෝ | | | |
| මුළු ණයගැතියෝ | | 655,299,750 | 535,156,493 |
| අඩු කළා: අපහරණය සඳහා වෙන්කිරීම | | (38,904,671) | (36,092,013) |
| | | 616,395,079 | 499,064,480 |
| **14.2** ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දේ | | | |
| පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු දේ - වියදම් ප්‍රතිපූරණය | | 6,818,530 | 6,477,402 |
| ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දේ - කිරි ගෙවීම් සහනාධාර - පවත්නා | | 30,930,979 | 30,930,979 |
| ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දේ - කිරි ගෙවීම් සහනාධාර - 2006ට පෙර | | 34,771,803 | 34,771,803 |
| ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දේ - කිරියා පරිවර්තනය (14.5) | | 347,961,144 | 347,961,144 |
| ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දේ - ලංකා කිරි කර්මාන්ත - ජංගම ගිණුම | | 1,117,224 | 1,117,224 |
| පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු දේ | | 94,333 | 94,333 |
| ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දේ - NLDB/Lanlib | | 3,000,000 | 3,000,000 |
| | | 424,694,013 | 424,352,885 |
| අඩුකළා: අපහරණය සඳහා වෙන්කිරීම | | (35,320,580) | (35,320,580) |
| | | 389,373,433 | 389,032,305 |
| **14.3** වෙනත් ණයගැතියෝ | | | |
| මුළු ලැබිය යුතු දේ | | 15,341,226 | 8,345,078 |
| | | 15,341,226 | 8,345,078 |
| **14.4** කාර්යමණ්ඩල ණයකරුවෝ | | | |
| මුළු ලැබිය යුතු දේ | | 159,243,687 | 136,860,659 |
| | | 159,243,687 | 136,860,659 |

**14.5** මෙම මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 1.1 හි සඳහන් ගිවිසුම පරිදි, මෙම මුදල් ප්‍රමාණය ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතුව ඇත. තව ද රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම තම 2000 අගෝස්තු 08 දින දරණ ලිපි මගින් විස්තර කර ඇති පරිදි, 1998 පෙබරවාරි 03 දින සිට පැවති බැරකම්වල ප්‍රතිඵල වශයෙන් ඇතිවන අතිරේක බැරකම් ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දෑ ගිණුම්ගත කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

එබඳු අයකර ගත යුතු ප්‍රමාණයන්, අංක 24 සටහනෙහි දක්වා ඇති අයබදු හා වෙනත් ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකිරීමට යොදා ගත හැකි ද යන වග ශ්‍රී ලංකා රජය සමග සමාගම විසින් සාකච්ඡා කරනු ලැබේ. එබැවින් එම ශේෂ ආපසු අයකර ගැනීම රජයේ තීරණය මත රඳා පවතී.

| | | 2014 මාර්තු 31 දිනට රු. | 2013 මාර්තු 31 දිනට රු. |
|---|---|---|---|
| **15.** | මූල්‍ය මෙවලම - කල්පිරීම දක්වා තබා ගැනේ | | |
| **15.1** | කෙටි කාලීන ස්ථාවර තැන්පතු | | |
| | මහජන බැංකුව - ආයතනික බැංකු ශාඛාව | - | 175,000,000 |
| | ලංකා බැංකුව - විදේශීය ගනුදෙනුකාර ඒකකය | 325,000,000 | - |
| | ලංකා බැංකුව - භාණ්ඩාගාරය | - | 100,000,000 |
| | ඇමතුම් තැන්පතු | - | 19,500,000 |
| | | 325,000,000 | 294,500,000 |
| **15.2** | දිගුකාලීන ස්ථිර තැන්පතු | | |
| | ලංකා බැංකුව - භාණ්ඩාගාරය | 318,666,267 | 247,489,399 |
| | ස්ථිර තැන්පතු - ලංකා බැංකුව ඇ.බො. 4,491,415/- | 587,515,746 | 543,722,342 |
| | | 906,182,013 | 791,211,741 |

මූල්‍ය ආයතනවලින් විවිධ මූල්‍ය ආධාර ලබා ගැනීම සඳහා ඇප වශයෙන් තබා ඇති ආයෝජන මෙම මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 31 මගින් හෙළිකරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| **16.** | මුදල් සහ මුදලට සමාන දේ | | |
| | බැංකුවල පවත්නා ශේෂය | 28,734,485 | 70,198,394 |
| | අතැති සුළු මුදල් | 5,013,679 | 3,390,666 |
| | | 33,748,164 | 73,589,060 |
| **17.** | ප්‍රකාශිත ප්‍රාග්ධනය | | |
| | | ප්‍රමාණය | ප්‍රමාණය |
| | ප්‍රකාශිත ප්‍රාග්ධන ප්‍රමාණය | 31,945,406 | 31,945,406 |
| | | රු. | රු. |
| | ප්‍රකාශිත ප්‍රාග්ධන වටිනාකම | 319,454,060 | 319,454,060 |
| **18.** | ප්‍රාග්ධන සංචිත | | |
| **18.1** | පිරියත සහ යන්ත්‍ර ලබාගැනීම සහ තත්ත්වයෙන් උසස් කිරීම සඳහා සංචිත | | |
| | රඳවාගත් ඉපැයීම්වලින් මාරු කළා | 25,000,000 | 25,000,000 |
| | | 25,000,000 | 25,000,000 |

ඉහත සඳහන් සංචිතය 2008 / 2009 වර්ෂයේ ආදායම් සංචිතයෙන් ගොඩනගන ලදි. එය බලශක්ති යන්ත්‍රාගාරය, වාණුහරණ යන්ත්‍ර ආදි වැඩි ධාරිතාවක් ඇති යන්ත්‍රාගාර සහ යන්ත්‍ර ලබා ගැනීමට යොදා ගන්නවා ඇත.

| | | | |
|---|---|---|---|
| **19.** | නිදන් අරමුදල | | |
| | රඳවාගත් ඉපැයීම්වලින් මාරුකළා | 1,689,978 | 1,689,978 |
| | | 1,689,978 | 1,689,978 |

ගොවියන්ට භාජන විකිණීමෙන් උපයාගත් මුදල යොදවා නිදන් අරමුදල නිර්මාණය කරන ලදි. මෙම අරමුදල ආපසු අයකර ගැනීමේ පදනම මත ගොවීන්ට නිකුත් කරන දෑවල මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට භාවිතා කෙරේ.

| | | | 2014 මාර්තු 31 දිනට රු. | 2013 මාර්තු 31 දිනට රු. |
|---|---|---|---|---|
| **20.** | විලම්භිත බදු | | | |
| | වර්ෂය ආරම්භයේ දී | | 19,857,289 | - |
| | විස්තරාත්මක ආදායම් ප්‍රකාශයට භාරය | | 6,094,885 | 19,857,289 |
| | වර්ෂය අවසානයේ දී | | 25,952,174 | 19,857,289 |
| **20.1** | දේපළ, පිරියත සහ උපකරණ මත, තාවකාලික වෙනස මත බදු බලපෑම | | 83,351,471 | 70,679,387 |
| | විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම මත, තාවකාලික වෙනස මත බදු බලපෑම | | (43,425,050) | (40,129,712) |
| | අඩු කළා: බදු අලාභ මත තාවකාලික වෙනස මත බදු බලපෑම | | (13,974,247) | (10,692,386) |
| | විලම්භිත බදු බැඳීමෙහි විභව්‍යතාව | | 25,952,174 | 19,857,289 |

භාවිතයට නොගත් බදු පාඩු ප්‍රයෝජනයට ගත හැකි පවත්නා බදු අය කළ හැකි තාවකාලික ශුද්ධ වෙනසෙන් 35% දක්වා පමණක් ඉදිරියට ගෙන ආ ප්‍රයෝජනයට නොගත් බදු පාඩුවලින් පැනනගින විලම්භිත බදු වත්කම් හඳුනාගෙන ඇත.

| | | | 2014 මාර්තු 31 දිනට රු. | 2013 මාර්තු 31 දිනට රු. |
|---|---|---|---|---|
| **21.** | ණය සහ ණය ගැනීම් | | | |
| **21.1** | පොළී සහිත ණය ගැනීම් | | | |
| | වසරක් තුළ ගෙවිය හැකි | 21.1.1 and 21.1.2 | 102,105,535 | 92,751,742 |
| | වසරකට පසු ගෙවිය හැකි | 21.1.1 and 21.1.2 | 493,912,087 | 581,685,663 |
| | | | 596,017,622 | 674,437,405 |
| **21.1.1** | දළ මූල්‍ය කල්බදු - ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව | | | |
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | | 115,652,952 | 154,203,936 |
| | **එකතු කළා:** වර්ෂය තුළ එකතු කිරීම් | | - | - |
| | **අඩු කළා:** වර්ෂය තුළ ගෙවීම් | | (38,550,984) | (38,550,984) |
| | වර්ෂය අවසානයේ ශේෂය | | 77,101,968 | 115,652,952 |
| | අත්හිටවූ පොලි | | | |
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | | 30,382,182 | 50,457,451 |
| | වර්ෂය තුළ ලබාගත් කල්බදු පහසුව සඳහා අත්හිටවූ පොලිය | | - | - |
| | **අඩු කළා:** ආදායම් ප්‍රකාශයට මාරු කළ ප්‍රමාණය | | (15,799,262) | (20,075,269) |
| | වර්ෂය අවසානයේ ශේෂය | | 14,582,920 | 30,382,182 |
| | ශුද්ධ වගකීම | | 62,519,048 | 85,270,770 |
| | වර්තමාන කල්පිරුන ප්‍රමාණය | | 28,017,364 | 22,751,722 |
| | දීර්ඝ කාලීන කල්පිරුන ප්‍රමාණය | | 34,501,684 | 62,519,048 |
| | | | 62,519,048 | 85,270,770 |
| **21.1.2** | බැංකු ණය සහ ණයට ගැනීම් | | | |
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | | 589,166,635 | 625,150,559 |
| | වර්ෂය තුළ ලැබීම් | | 16,834,500 | 34,016,096 |
| | **අඩු කළා:** වර්ෂය තුළ ගෙවීම් | | (72,502,561) | (70,000,020) |
| | වර්ෂය අවසානයේ දී ශේෂය | | 533,498,574 | 589,166,635 |
| | වර්තමාන කල්පිරුන ප්‍රමාණය | | 74,088,171 | 70,000,020 |
| | දීර්ඝ කාලීන කල්පිරුන ප්‍රමාණය | | 459,410,403 | 519,166,615 |
| | | | 533,498,574 | 589,166,635 |

මෙම මූල්‍ය ප්‍රකාශවල අංක 31 සටහනෙහි ඉහත සඳහන් ණය සහ ණයට ගැනීම් සඳහා ඇප වශයෙන් තබන ලද වත්කම් දක්වා ඇත.

| | | 2014 මාර්තු 31 දිනට රු. | 2013 මාර්තු 31 දිනට රු. |
|---|---|---|---|
| **21.** | **බැංකු ණය සහ ණයට ගැනීම් (ඉතිරි කොටස)** | | |
| **21.2** | පොලී රහිත ණයට ගැණුම් | | |
| | දිගු කාලීන කොටස | | |
| | ජාතික කිරි මණ්ඩලය | 2,108,063 | 2,108,063 |
| | කෘෂිකර්ම සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 83,590,654 | 83,590,654 |
| | | 85,698,717 | 85,698,717 |
| **22.** | විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂික | | |
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | 401,297,112 | 351,719,255 |
| | වර්ෂය සේවා පිරිවැය | 25,143,799 | 23,894,066 |
| | පොලී පිරිවැය | 44,142,684 | 38,689,118 |
| | උපකල්පන වෙනස් වීම නිසා ඇති වූ (ලාභය)/ අලාභය | (25,969,240) | (8,305,315) |
| | වර්ෂය තුළ ගෙවීම් | (10,363,855) | (4,700,012) |
| | වර්ෂය අවසානයේ දී ශේෂය | 434,250,500 | 401,297,112 |

ප්‍රකාශිත ඒකක ණය ක්‍රමය උපයෝගී කොට ගෙන 2014 මාර්තු 31 දිනට අර්ථ දක්වන ලද පාරිතෝෂික ප්‍රතිලාභ සැලැස්ම ගැන ආයුගණක ඇගයීමක් Actuarial and Management Consultants (Pvt.) Limited Actuaries විසින් සිදුකරන ලදී විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය නිර්ණය කිරීමේ දී යෝග්‍ය සහ ගැලපෙන උපකල්පන භාවිතා කරන ලදී.

**යොදාගත් ප්‍රධාන උපකල්පන මෙසේ ය.:**

| | 2014 | 2013 |
|---|---|---|
| අපේක්ෂිත වැටුප් වර්ධකය | 10% p.a | 10% p.a |
| වට්ටම් අනුපාතය | 11% p.a | 11% p.a |
| කාර්යමණ්ඩල පිරිවැටුම් සාධකය | 5% p.a | 5% p.a |
| උපරිම විශ්‍රාමික වයස | අවුරුදු 60 | අවුරුදු 60 |

**ආයුගණක ඇගයීමේ දී භාවිත කළ උපකල්පනවල සංවේදීතාවය**

සේවක ප්‍රතිලාභ ගැන වගකීමේ මිනුමේ දී වෙනත් විචල්‍යතා නොවෙනස්ව තබන අතර, යොදාගත් මුඛ්‍ය උපකල්පනවල සහේතුකව සිදුවිය හැකි වෙනසකට දක්වන සංවේදීතාව පහත සඳහන් වගුව ගෙනහැර දක්වයි.

වට්ටම් අනුපාතයෙහි සහ වැටුප් වර්ධක අනුපාතයෙහි උපකල්පිත වෙනස්වීම් ලාභ හෝ අලාභ සහ වර්ෂයේ සේවක ප්‍රතිලාභ බැඳීම කෙරෙහි දක්වන බලපෑම, විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සංවේදීතාවය ලෙෂ දැක්විය හැක.

| වට්ටම් අනුපාතයෙහි වැඩිවීම / (අඩුවීම) | වැටුප් වර්ධක අනුපාතයෙහි වැඩිවීම / (අඩුවීම) | වෙනස් වීම විස්තරාත්මක ආදායම් ප්‍රකාශය කෙරෙහි දක්වන බලපෑම රු. | සේවක ප්‍රතිලාභ බැඳීම කෙරෙහි බලපෑම රු. |
|---|---|---|---|
| 1% | * | 28,942,403 | (28,942,403) |
| -1% | * | (32,777,999) | 32,777,999 |
| ** | 1% | (32,814,356) | 32,814,356 |
| ** | -1% | 29,459,913 | (29,459,913) |

* සමාගම සඳහා වැටුප් වර්ධක අනුපාතය 10%

** වට්ටම් අනුපාතය 11%

| | | | 2014 මාර්තු 31 දිනට රු. | 2013 මාර්තු 31 දිනට රු. |
|---|---|---|---|---|
| 23 | රාජ්‍ය ප්‍රදාන | | | |
| 23.1 | වර්ෂය ආරම්භයේ දී ශේෂය | | 52,297,084 | 52,297,084 |
| | වර්ෂය තුළ ලද ප්‍රදාන | | - | 37,200,000 |
| | වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයෙන් හඳුනාගත් ප්‍රදාන | | | |
| | වර්ෂය තුළ ආදායම් | | 11,134,742 | 37,200,000 |
| | වර්ෂය අවසානයේ දී ශේෂය | 23.2. | 41,162,342 | 52,297,084 |
| 23.2 | විලම්භිත රාජ්‍ය ප්‍රදාන | | | |
| | සමන්තුරේ සඳහා ප්‍රදාන | | 1,601,600 | 1,747,200 |
| | තිරුක්කෝවිල් සඳහා ප්‍රදාන | | - | 1,931,000 |
| | තිම්ලතිව් සඳහා ප්‍රදාන | | 1,980,000 | 2,160,000 |
| | කිරි භාජන ප්‍රදාන | | 114,392 | 114,392 |
| | වත්කම් ප්‍රදාන | | 3,049,981 | 8,094,492 |
| | අලෙවිසැල් 14ට කළ ප්‍රදාන | | 975,000 | 1,050,000 |
| | LCRD ප්‍රදාන | | 33,441,369 | 37,200,000 |
| | | | 41,162,342 | 52,297,084 |
| 24. | වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දේ | | | |
| | වෙළෙඳ ණය හිමියෝ | | 133,481,778 | 137,088,290 |
| | වියදම් ණයහිමියෝ | | 209,566,154 | 204,880,968 |
| | වෙනත් ගෙවීම් | 24.1 | 638,730,072 | 635,978,823 |
| | | | 981,778,004 | 977,948,081 |

**24.1** වෙනත් ගෙවීමට ඇති මුදල්වලට දීර්ඝ කාලීනව හිඟව තිබෙන ශේෂයක් වන රු. 512,468,267/- ඇතුළත් ය. එයට "සීමාසහිත ලංකා කිරියා කිරි කර්මාන්ත (පුද්.)" සමාගමෙන් වත්කම් සහ බැරකම් "සීමාසහිත මිල්කෝ (පුද්.)" සමාගමට මාරු කළ දිනයේ සිට හිඟව පැවති රු. 505,521,564/- ඇතුළත් ය. ඉහත දැක් වූ මුදලට දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට සහ වෙනත් රජයේ ආයතනවලට ගෙවිය යුතු ව්‍යවස්ථාපිත බැරකම් ඇතුළත් ය.

එබඳු අයකර ගත යුතු මුදල් අංක 14.5 හි සඳහන් මුදල්වලට හිලව් වශයෙන් යොදා ගැනීම ගැන සමාගම මේ වන විට රජය සමග සාකච්ඡා පවත්වයි.

| | | 2014 මාර්තු 31 දිනට රු. | 2013 මාර්තු 31 දිනට රු. |
|---|---|---|---|
| **25.** ආදායම් බදු | | | |
| ගෙවිය යුතු/ලැබිය යුතු ආදායම් බදු | **25.1** | 29,629,285 | 29,629,285 |
| රඳවා ගැනීමේ බද්ද ලැබිය යුතු | | (4,346,691) | (11,334,279) |
| ආර්ථික සේවා බද්ද ලැබිය යුතු | | (11,615,362) | (8,377,530) |
| | | 13,667,232 | 9,917,476 |
| **25.1** ගෙවිය යුතු (ලැබිය යුතු) ආදායම් බදු | | | |
| වර්ෂය ආරම්භයේ දී ශේෂය | | 29,629,285 | 29,629,285 |
| **එකතු කළා:** වර්ෂය සඳහා වෙන්කිරීම් ආදායම් බදු | | 14,604,555 | 10,697,242 |
| | | 44,233,840 | 40,326,527 |
| **අඩු කළා:** වර්ෂය තුළ සිදුකළ ගෙවීම් | | - | - |
| බදු බැර - වගකීම්වලට එරෙහිව යොදාගත් | | | |
| - ආර්ථික සේවා බද්ද | | (14,604,555) | (10,697,242) |
| ගෙවිය යුතු දළ ආදායම් බද්ද | | 29,629,285 | 29,629,285 |
| **26.** බැංකු අයිරා | | | |
| ලංකා බැංකුව - 1758 | | 428,958,934 | 354,552,803 |
| ලංකා බැංකුව - 1766 | | 13,361,143 | 11,616,180 |
| මහජන බැංකුව - 41180210331 | | 299,856,717 | 160,336,870 |
| මහජන බැංකුව - 41120210937 | | 13,937,425 | 14,910,062 |
| ලංකා බැංකුව - 1279942 | | - | 1,268,198 |
| ලංකා බැංකුව - 1471 | | 1,614,042 | - |
| අරමුදල් මාරු කිරීම | | 89,366 | 86,376 |
| | | 757,817,627 | 542,770,489 |

**27.** හඳුනා නොගත් ගිවිසුම්ගත බැඳීම්

ගිවිසම්ගත වුව ද ප්‍රතිපාදන සලස්වා නැති ප්‍රාග්ධන බැඳීම් ද, මණ්ඩලය මගින් බලය පවරා ඇතත් ගිවිසුම්ගත නොවූ ප්‍රාග්ධන බැඳීම ද වාර්තාකරණ දිනට ඉතිරිව නොතිබුණි.

**28.** අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම්

**28.1** අසම්භාව්‍ය බැරකම්

ශේෂ පත්‍ර දිනයට කිසිදු අසම්භාව්‍ය බැරකමක් තිබී නොමැත.

**28.2** අසම්භාව්‍ය වත්කම්

ශේෂ පත්‍ර දිනයට කිසිදු අසම්භාව්‍ය වත්කමක් තිබී නොමැත.

**29.** සම්බන්ධිත පාර්ශ්වයන් හෙළිදරව් කිරීම.

**29.1** සත්‍ය කොටස් අයිතිය සහ උපරිම අයිතිය

සමාගම සම්පූර්ණයෙන් ම රජයට අයත් ව්‍යවසායක් වන අතර සමාගමේ සාමාන්‍ය කොටස්වලින් 100% ක්ම රජය සතු වේ.

**29.2** ප්‍රධාන කළමනාකාර නිලධාරී පිරිස පිළිබඳ තොරතුරු

සමාගමේ ක්‍රියාකාරකම්, ආශ්‍රිත පාර්ශ්වයන් ඇතුළු සියළු අධ්‍යක්ෂවරු ද (විධායක හෝ වෙනත්) කටයුතු සෘජුව හෝ වක්‍රව සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය පිළිබඳව බලය හා වගකීම දරන පිරිස ප්‍රධාන කළමනාකරණ පිරිස වේ.

වර්ෂය තුළ අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන කළමනාකාර පිරිසගේ පාරිශ්‍රමික පහත සඳහන් පරිදි වේ. :

| | 2013/2014<br>රු. | 2012/2013<br>රු. |
|---|---|---|
| කෙටි කාලීන සේවක ප්‍රතිලාභ | 14,111,973 | 12,361,514 |

**29.3** ආශ්‍රිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු

සමාගමේ අධ්‍යක්ෂවරුන් කළ ප්‍රකාශ පරිදි, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව හෙළි කළ යුතු විශේෂිත පාර්ශ්වීය ගනුදෙනු අදාළ කාලය තුළ සිදු නොවීය.

**30.** සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන වර්ෂය සඳහා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවලට අනුකූලව අවශ්‍යතන්හි සංසන්දනාත්මක සංඛ්‍යා නැවත වර්ගීකරණය කරන ලදී.

**31.** ඇප වශයෙන් තබා ඇති වත්කම්

වගකීම් සඳහා ඇප වශයෙන් පහත සඳහන් වත්කම් තබා ඇත.

| වගකීම්වල ස්වභාවය සහ බැංකුවේ නම | ලබාදුන් ණය / පහසුව රු. | 2014.03.31ට ගෙවිය යුතුව තිබූ ශේෂය රු. | 2013.03.31ට ගෙවිය යුතුව තිබූ ශේෂය රු. | අපසු ගෙවීම | තැබූ ඇපය |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව ලබාදුන් ණය | 700,000,000 | 533,498,574 | 589,166,635 | සමාන මාසික රු. 5,833,335/- බැගින් වන වාරික 120කින් ගෙවීම | i) ලංකා බැංකුවේ තැබූ රු.315,500,000 ක් වටිනා ස්ථිර තැන්පතු.<br>ii) ලංකා බැංකුවේ තැබූ ඇ.ඩො. 4,095,896.38 ක් වටිනා ස්ථිර තැන්පතු |
| ලංකා බැංකුව ලබාදුන් අයිරාව | 384,000,000 | 428,958,934 | 354,552,803 | ඉල්ලීම අනුව | i) ඇසුරුම් ද්‍රව්‍ය තොග, නිමි භාණ්ඩ සහ සමාගමේ වර්තමාන සහ අනාගත පොත් දිනවලට බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, නාරාහේන්පිට නාවල පාරේ අංක 45 දරණ ස්ථානයෙහි ගබඩා කර ඇති වෙනත් චංචල දේපළ ඇතුළු අලෙවියට යටත් චංචල දේපළ සහ බැඳීමෙහි ප්‍රතිඵල වශයෙන් පවත්නා දේ. |
| මහජන බැංකුව ලබාදුන් බැංකු අයිරාව | 45,000,000<br>20,000,000<br>40,000,000 | 299,856,717 | 160,336,870 | ඉල්ලීම අනුව<br>ඉල්ලීම අනුව<br>ඉල්ලීම අනුව | i) මහජන බැංකුවේ තැබූ රු.50,000,000 ක් වටිනා ස්ථිර තැන්පතු<br>ii) මහජන බැංකුවේ තැබූ රු.25,000,000 ක් වටිනා ස්ථිර තැන්පතු.<br>iii) මහජන බැංකුවේ තැබූ රු.50,000,000 ක් වටිනා ස්ථිර තැන්පතු. |

**32.** ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

වාර්තා කරන දිනය සහ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට බලය දුන් දිනය අතර, මූල්‍ය ප්‍රකාශයන්හි ගැලපීම් සහ හෙළිකිරීම් අවශ්‍ය වන සැලකිය යුතු සිදුවීම් නොමැත.

**33.** සංසන්දනාත්මක සංඛ්‍යා

වර්තමාන වර්ෂයේ ඉදිරිපත් කිරීමේ අවශ්‍යතා අනුව අවශ්‍ය තන්හි සංසන්දනාත්මක සංඛ්‍යා නැවත වර්ගීකරණය කර ඇත.

**34.** මූල්‍ය මෙවලම්වල සාධාරණ අගය

**34.1** ක්‍රමක්ෂය පිරිවැය මත පවත්නා මූල්‍ය මෙවලම්වල සාධාරණ අගය

මූල්‍ය ප්‍රකාශවල සාධාරණ අගය මත නොපවත්නා සමාගමෙහි මූල්‍ය මෙවලම්වල පවත්නා අගයන් සහ සාධාරණ අගයන් වර්ග අනුව සසඳා පහත දක්වනු ලැබේ. මෙම වගුවෙහි මූල්‍ය නොවන වත්කම් සහ වගකීම්වල සාධාරණ අගය සඳහන් නොවේ.

| | පවත්නා ප්‍රමාණය (රු.) | සාධාරණ අගය (රු.) |
|---|---|---|
| මූල්‍ය වත්කම් | | |
| මූල්‍ය මෙවලම - කල්පිරීම දක්වා තබා ගැනීම | 1,231,182,013 | 1,231,182,013 |
| වෙළෙඳාම සහ වෙනත් ලැබිය යුතු දෑ | 1,321,965,074 | 1,321,965,074 |
| සම්පූර්ණ මූල්‍ය වත්කම් | 2,553,147,087 | 2,553,147,087 |
| මූල්‍ය වගකීම් | | |
| වෙළෙඳාම සහ වෙනත් ගෙවිය යුතු දෑ | 1,321,965,074 | 1,321,965,074 |
| පොලී සහිත ණය දීම සහ ණය ගැනීම | 533,498,574 | 533,498,574 |
| සම්පූර්ණ මූල්‍ය වගකීම් | 1,855,463,648 | 1,855,463,648 |

**සාධාරණ අගය මත නොපවත්නා මූල්‍ය වත්කම් සහ වගකීම්වල සාධාරණ අගය**

මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ අගය මත දැනටමත් වාර්තා කර නැති මූල්‍ය මෙවලම්වල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා යොදාගත් ක්‍රමවේද සහ උපකල්පනයන් පහත විස්කර කරනු ලැබේ.

**සාධාරණ අගය පවත්නා අගයට සමීප වන වත්කම්**

කෙටිකාලීන කල්පිරීම සහිත මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සඳහා පවත්නා අගය සාධාරණ අගයට සමීප වන බව උපකල්පනය කරනු ලැබේ. විශේෂිත කල්පිරීමේ කාලයක් නැති ඉල්ලුම් තැන්පතු සහ ඇමතුම් තැන්පතු සඳහා ද මෙම උපකල්පනය අදාළ වේ.

## 35. මූල්‍ය අවදානම් කළමනාකරණය - අරමුණු සහ ප්‍රතිපත්ති

### 35.1 හඳුන්වා දීම

අවදානම සමාගමේ කටයුතුවලට ආවේණික වූවකි. නමුත් එය අවදානමෙහි සීමාවන්ට සහ වෙනත් පාලක මාර්ගවලට යටත්ව සිදුවන හඳුනා ගැනීම්, මැනීම් සහ පසුවිපරම් ඇතුළත් ක්‍රියාමාර්ගයක් මගින් කළමනාකරණය කරනු ලැබේ. සමාගමේ අඛණ්ඩ ලාභදායිත්වය සඳහා මෙම සමාගමේ සෑම සේවකයෙක් ම තම වගකීම්වලට අදාළ අවදානම් නිරාවරණතාව ගැන වගකිව යුතු ය.

**අවදානම් කළමනාකරණ රාමුව**

සමාගමේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීම සහ අධීක්ෂණය සම්බන්ධ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු ය. අධ්‍යක්ෂ මණ්ඩලය මේ සම්බන්ධ අධිකාරය, සමාගමෙහි අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති වර්ධනය කොට පසුවිපරම් කිරීම ගැන වගකියන ප්‍රධාන කළමනාකරණ පිරිසට පවරා ඇත.

**ප්‍රධාන මූල්‍ය මෙවලම්**

සමාගම භාවිතා කරන්නා වූ අවදානම පැනනගින ප්‍රධාන මූල්‍ය මෙවලම් මෙසේ ය.

| මෙවලම | අවදානම |
|---|---|
| · වෙළඳාමෙන් ලැබිය යුතු දෑ | ණය අවදානම |
| · මුදල් සහ මුදල්වලට සමාන දෑ | ද්‍රවශීලතා අවදානම |
| · වෙළෙඳාම සහ වෙනත් ගෙවිය යුතු දෑ | ද්‍රවශීලතා අවදානම |
| · බැංකු අයිරා | ද්‍රවශීලතා අවදානම |
| · බැංකු ණය | පොළී අනුපාත අවදානම / ද්‍රවශීලතා අවදානම |

### 35.2 ණය අවදානම - පැහැර හැරීමේ අවදානම

ණය ගත්තවුනට තම වගකීම් ඉටු කිරීම අවිනිශ්චිත වීම නිසා ණය අවදානම ඇති වේ. ණය ගත්තවුනට ණය ගෙවීමට නොහැකි වීම හෝ එසේත් නැත්නම් ගිවිසුම්ගත බැඳීමක් ඉටු කිරීමට නොහැකි වීම නිසා ණයට දුන් මුල් මුදල අහිමි වීම හෝ මූල්‍ය ප්‍රතිලාභයක් අහිමි වීම සිදු විය හැක.

### 35.3 ද්‍රවශීල අවදානම සහ අරමුදල් සම්පාදන කළමනාකරණය

සමාගමට ගෙවීමට ඇති වගකීම් ඉටු කිරීමට ප්‍රමාණවත් මුදල් නොමැති අවස්ථා ද්‍රවශීල අවදානම පවතින අවස්ථා හැටියට සලකනු ලැබේ. සමාගමේ වත්කම්වල කල්පිරීමේ ස්වභාවය සහ වගකීම් අතර නොගැලපීම නිසා මෙම තත්ත්වය මූලික වශයෙන් ඇති වේ. සමාගමේ මූල්‍ය වගකීම් ඉටු කිරීමට සහ වර්ධනය වන ව්‍යාපාරික ධාරිතාව සඳහා අවශ්‍ය අරමුදල් ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලභාවයක් තිබීම තීරණාත්මක වේ.

වෙළෙඳ පොළ පුරා ව්‍යාපාරික කටයුතු සඳහා ප්‍රමාණවත් අරමුදල් ලැබීම සහතික කිරීම සමාගමේ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණයේ මූලික අරමුණයි.

## 35. මූල්‍ය අවදානම් කළමනාකරණය - අරමුණු සහ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)

**35.3.1** ඉතිරිව ඇති ගිවිසුම්ගත කල්පිරීම් මගින් මූල්‍ය වත්කම් සහ වගකීම් විශ්ලේෂණය කිරීම.

| සමාගම | ඉල්ලුම පරිදි<br>රු. | මාස 2ට අඩු<br>රු. | මාස 2 සිට 12 දක්වා<br>රු. | අවු. 1 සිට 5 දක්වා<br>රු. | අවු. 5ට වැඩි<br>රු. | මුළු ගණන<br>රු. |
|---|---|---|---|---|---|---|
| මූල්‍ය වත්කම් | | | | | | |
| මූල්‍ය මෙවලම - කල්පිරීම දක්වා තබා ගැනීම | - | 325,000,000 | 906,182,013 | - | - | 1,231,182,013 |
| වෙළෙඳාම සහ වෙනත් ලැබිය යුතු දෑ | - | 396,639,523 | 264,393,015 | 198,244,761 | 462,687,777 | 1,321,965,076 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 33,748,164 | - | - | - | - | 33,748,164 |
| සම්පූර්ණ මූල්‍ය වත්කම් | 33,748,164 | 721,639,523 | 1,170,575,028 | 198,244,761 | 462,687,777 | 2,586,895,253 |
| මූල්‍ය වගකීම් | | | | | | |
| වෙළෙඳාම සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 240,191,553 | 192,153,243 | 211,368,569 | 317,052,850 | 960,766,215 |
| පොලී සහිත ණය දීම ණය ගැනීම | - | 18,682,877 | 93,620,347 | 384,547,903 | 99,166,495 | 596,017,622 |
| බැංකු අයිරා | 757,817,627 | - | - | - | - | 757,817,627 |
| සම්පූර්ණ මූල්‍ය වගකීම් | 757,817,627 | 258,874,430 | 285,773,590 | 595,916,472 | 416,219,345 | 2,314,601,464 |
| **සම්පූර්ණ ශුද්ධ මූල්‍ය වත්කම් / (වගකීම්)** | (724,069,463) | 462,765,093 | 884,801,438 | (397,671,711) | 46,468,432 | 272,293,789 |

**35.4** පොලී අනුපාත වගකීම්

ණය පහසුකම් සැලසීම, තැන්පතු ලබා ගැනීම සහ ණය ලැබීමේ මෙවලම් නිකුත් කිරීම වැනි මධ්‍ය ව්‍යාපාරික කටයුතුවලින් පැනනගින හානිකර සහ අනපේක්ෂිත අනාගත පොලී අනුපාත වෙනස්වීම් නිසා සමාගම වෙළෙඳ පොළ අවදානමට නිරාවරණය වීමේ මුඛ්‍ය සංඝටකයකි.

වාර්තා කරන දිනය වන විට, පොලී අනුපාතයට සංවේදී වන මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් සමාගම සතු නොවීම ය.

## මෙහෙයුම් ප්‍රතිඵල

| | | 2013/2014 | 2012/2013 | 2011/2012 | 2010/2011 | 2009/2010 |
|---|---|---|---|---|---|---|
| පිරිවැටුම (ශුද්ධ) | Rs. 000' | 7,019,769 | 6,385,234 | 5,263,152 | 4,548,974 | 4,093,052 |
| දළ ලාභය | Rs. 000' | 1,005,692 | 486,433 | 221,896 | 536,949 | 697,490 |
| බද්දට පෙර ලාභය | Rs. 000' | 161,107 | (267,468) | (244,788) | 110,664 | 338,725 |
| ආදායම් බදු වියදම් | Rs. 000' | (20,699) | (30,555) | (10,918) | (27,472) | (37,975) |
| බද්දට පසු ලාභය | Rs. 000' | 140,408 | (298,023) | (255,706) | 83,192 | 300,750 |

## ශේෂ පත්‍රය

| | | 2013/2014 | 2012/2013 | 2011/2012 | 2010/2011 | 2009/2010 |
|---|---|---|---|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | රු. 000’ | 319,454 | 319,454 | 319,454 | 319,454 | 319,454 |
| රඳවාගත් ඉපැයුම් | රු. 000’ | 911,973 | 745,596 | 1,035,313 | 1,191,279 | 1,108,087 |
| නිදල් අරමුදල | රු. 000’ | 1,690 | 1,690 | 1,690 | 1,690 | (11,264) |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ තත්ත්වයෙන් උසස් කිරීම / ප්‍රතිස්ථාපනය සඳහා සංචිතය | රු. 000’ | 25,000 | 25,000 | 25,000 | 25,000 | 25,000 |
| ප්‍රතිඇගයුම් සංචිතය | රු. 000’ | 336,455 | 336,455 | 336,455 | 336,455 | 336,455 |
| කොටස්කරුවන්ගේ අරමුදල | රු. 000’ | 1,594,572 | 1,428,195 | 1,717,912 | 1,873,878 | 1,777,732 |
| දේපල, පිරියත සහ උපකරණ | රු. 000’ | 2,244,073 | 2,123,362 | 2,275,337 | 664,893 | 572,074 |
| ශුද්ධ ජංගම වත්කම් (බැරකම්) | රු. 000’ | 1,205,867 | 445,668 | 537,718 | 1,629,923 | 1,452,398 |
| දිගු කාලීන / (විලම්භන වගකීම්) | රු. 000’ | (1,080,976) | (1,140,836) | (1,095,144) | (308,160) | (233,787) |

## අනුපාත

| | | 2013/2014 | 2012/2013 | 2011/2012 | 2010/2011 | 2009/2010 |
|---|---|---|---|---|---|---|
| කොටසකට ඉපැයුම් | රු. | 4.40 | (9.33) | (8.00) | 2.60 | 9.41 |
| කොටස් කරුවන්ගේ අරමුදලට මුළු වත්කම්/වරක් | | 2.84 | 2.94 | 2.37 | 1.63 | 1.66 |
| කෙටසකට ශුද්ධ වත්කම් | රු. | 46.79 | 44.71 | 53.78 | 62.19 | 56.06 |
| කොටස් කරුවන්ගේ හිමිකම් සඳහා ප්‍රතිලාභ | % | 10.43 | (20.29) | (14.88) | 4.19 | 16.80 |
| දළ ලාභ අනුපාතය | % | 14.33 | 7.62 | 4.22 | 11.80 | 17.04 |
| ශුද්ධ ලාභ අනුපාතය | % | 2.00 | (4.67) | (4.86) | 1.83 | 7.35 |
| ශුද්ධ වත්කම් අනුපාතය / වරක් | | 1.23 | 1.27 | 1.43 | 2.73 | 2.54 |
| ක්ෂණික වත්කම් අනුපාතය / වරක් | | 0.91 | 0.94 | 1.04 | 2.36 | 1.98 |